# 1

# සමස්ත නිරීක්ෂණ

මෑත වසරවලදී විභවතාවට වඩා අඩු වර්ධනයක් පෙන්නුම් කළ ශ්‍රී ලංකා ආර්ථිකය, කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය මධ්‍යයේ නවමු අභියෝග රැසකට මුහුණ දුන්නේය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, රට තුළ කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම සහ සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීම, ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම සහ රට තුළ පැවති අහිතකර කාලගුණික තත්ත්වයන්හි සමස්ත බලපෑම පිළිබිඹු කරමින්, ආර්ථිකය, පෙර වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුව තුළ දී සියයට 1.6කින් සංකෝචනය විය. වසංගතයේ ව්‍යාප්තියත් සමග ආර්ථිකයට ඇති වූ අවහිරතාවන්ගේ සත්‍ය ස්වභාවය සහ මෙම වසර තුළ දී අලුතින් එකතු වූ ක්‍රියාකාරකම් මෙන් ම, වැඩ කිරීමේ නව ක්‍රමවේද ග්‍රහණය කර ගැනීමේ ඇති අපහසුතාව පිළිබඳ සඳහන් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දෙවන කාර්තුව සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු නිකුත් කිරීම පමා කර ඇත. කෙසේ වෙතත්, 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී රට තුළ කොවිඩ්-19 ව්‍යාප්තිය නැවත ඉහළ යෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ගනු ලැබූ මැඩලීමේ ක්‍රියාමාර්ගවලට පෙරාතුව නිකුත් වී ඇති දත්තවලට අනුව ආර්ථිකයේ අංශ රාශියක ක්‍රියාකාරකම් වේගවත්ව යථා තත්ත්වයට පත්වීමේ ස්වභාවයක් පෙන්නුම් කළේය. රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සාමූහික ප්‍රයත්න තුළින් ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම සඳහා පහසුකම් සැලසුණි. වසංගතයේ බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත උපකාර කිරීම සඳහා සහන සැලසීමේ ක්‍රියාමාර්ග සහ විශාල පරිමාණයේ ප්‍රතිපත්ති සානුබල හඳුන්වා දෙනු ලැබීය. වසංගතය මගින් ඇති කරන ලද පෙර නොවූ විරූ අයහපත් වාතාවරණය යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කිහිප වතාවක් ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීම සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීම ඇතුළු මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණ ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාවට නංවනු ලැබීය. එම ක්‍රියාමාර්ග තුළින් වෙළඳපොළට ඉහළ ද්‍රවශීලතාවක් සැපයුණු අතර, ණය ගැනීම් සඳහා වන පිරිවැය සැලකිය යුතු ලෙස පහළ වැටුණි. කොවිඩ්-19 වසංගතය මගින් ඇති කළ අහිතකර බලපෑම්, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා සහනදායී ණය යෝජනා ක්‍රම මෙන් ම, වසංගතය මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයින්ට ලබා දුන් ණය ආපසු ගෙවීම සඳහා සහන කාලයක් හඳුන්වාදීමට ද හේතු විය. මෙම ක්‍රියාමාර්ග සඳහා ප්‍රතිචාර දක්වමින්, පෙර මාසවලදී දක්නට ලැබූ මන්දගාමී ප්‍රවණතාව වෙනස් කරමින්, 2020 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවලදී පෞද්ගලික අංශයට ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රාථමික වෙන්දේසිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම හරහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට අවශ්‍ය අරමුදල් සපයන ලදී. 2020 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවයක කාලපරිච්ඡේදය තුළ දී පුළුල් මුදල් සැපයුමේ වර්ධනයෙහි ඉහළ යෑම කෙරෙහි රාජ්‍ය අංශය සඳහා ලබා දුන් ණය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය. තවද, ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සඳහා සහාය දක්වමින්, දේශීය හා ගෝලීය ආර්ථික කටයුතු මන්දගාමී වීම තුළින් පැන නැගුණු අහිතකර බලපෑම්වලට මූල්‍ය පද්ධතිය ශක්තිමත්ව මුහුණ දුන්නේය. මේ අතර, වසංගතයේ මුල් අදියරවල දී දැඩි ලෙස බලපෑමට ලක් වූ විදේශීය අංශය, වෙළඳ ශේෂයෙහි වැඩිදියුණු වීම, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් යථා තත්ත්වයට පත්වීම, විනිමය අනුපාතිකය ස්ථාවර වීම සහ විදේශ නිල සංචිත ප්‍රමාණවත් මට්ටමක පැවතීම සමග සැලකිය යුතු ලෙස නැවත යථා තත්ත්වයට පත් විය. අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන හා සමහර විදේශ විනිමය ගෙවීම් සඳහා පනවන ලද සීමා කිරීම් මෙන් ම, ලෝක වෙළඳපොළේ තෙල් මිල ගණන් අඩු මට්ටමක පැවතීම, විදේශීය අංශයේ ස්ථායීතාව කෙරෙහි සාධනීය ලෙස බලපෑවේ ය. රජය හා මහ බැංකුව විසින් ගනු ලැබූ පූර්වෝපායික ක්‍රියාමාර්ග සහ 2020 ජූනි මාසයේ සිට විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල ලැබීම් අපේක්ෂිත මට්ටම ඉක්මවමින් යථා තත්ත්වයට පත්වීම, ගෝලීය වශයෙන් දිගින් දිගටම පනවා ඇති සංචාරක සීමා හේතුවෙන් සංචාරක ඉපැයීම්වල සිදු වූ සැලකිය යුතු පහළ යෑමෙහි බලපෑම කිසියම් දුරකට සමනය කිරීමට උපකාරී විය. ගෝලීය මූල්‍ය ප්‍රවාහ කෙරෙහි වසංගතය මගින් ඇති වූ බලපෑම් හේතුවෙන්, ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම අඩු ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම ද ඇතුළුව, රජය සහ මහ බැංකුව වෙත ලැබුණු විදේශ විනිමය ලැබීම්වල ප්‍රතිඵලයක් ලෙස දළ නිල සංචිත ප්‍රමාණවත් මට්ටමක පැවතුණි. අහිතකර සමපේක්ෂණ තත්ත්වයන් සහ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහළ දැමීම මධ්‍යයේ වුව ද, 2020 වසරේ ඔක්තෝබර් මුල් කාලයේ දී කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය පියවීම ද ඇතුළුව සියලු ණය සේවාකරණ වගකීම් සපුරාලීමට රජයට හැකි විය. මේ අතර, ආර්ථික කටයුතු මන්දගාමී වීම මධ්‍යයේ රජයේ ආදායම් පහළ යෑම හේතුවෙන්, රාජ්‍ය ආදායම සැලකිය යුතු ලෙස අඩු වූ අතර, පසුගිය වසරේ දී නොපියවූ බිල්පත් විශාල ප්‍රමාණයක් ඉදිරියට ගෙන ඒම හේතුවෙන් රජයේ වියදම් කළමනාකරණ ප්‍රයත්න වෙත අහිතකර බලපෑමක් ඇති විය. මැදිකාලීනව අයවැය හිඟය අඩු කිරීම සඳහා වන රජයේ සැලසුම්, ඉදිරි කාලයේ දී සාර්ව ආර්ථික ස්ථායීතාවයෙහි සහ රාජ්‍ය ණයෙහි තිරසාරත්වය තහවුරු කිරීමෙහි ලා ඉතා තීරණාත්මක වේ. මේ අතර, ආහාර මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් උද්ධමනයෙහි තාවකාලික ඉහළ යෑමක් දක්නට ලැබුණ ද, 2020 වසරේ මේ දක්වා කාලය තුළ දී උද්ධමනය සියයට 4-6 අතර ඉලක්කගත පරාසය තුළ බොහෝදුරට පවත්වා ගැනීම සඳහා මන්දගාමී ඉල්ලුම් තත්ත්ව සහ මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා උපකාරී විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ, සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් සමග මැදි කාලීනව උද්ධමනය මෙම පරාසය තුළ පවත්වා ගැනීමට අපේක්ෂිතය. මේ අතර, රජයේ වර්ධනාභිමුඛ ප්‍රතිපත්තිවල සහාය ඇතිව, ආර්ථික වර්ධනය 2021 වසරේ දී නැවත ඉහළ යනු ඇතැයි ද, මැදි කාලීනව ඉහළ ආර්ථික වර්ධන ප්‍රවණතාවක් පවත්වා ගනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වන ප්‍රතිපත්ති තුළින් ආර්ථිකයේ විදේශීය අංශය මත වන පීඩනය තිරසාර පදනමකින් ලිහිල් වනු ඇතැයි අපේක්ෂිතය. කෙසේ වෙතත්, ඉදිරි කාලය තුළ දේශීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ සහ නැවත නැගී සිටීමේ ප්‍රමාණය සහ එහි වේගය තීරණය කිරීමෙහිලා දේශීය හා ගෝලීය වශයෙන් කොවිඩ්-19 වසංගතය මැඩලීමේ සාර්ථකත්වය ඉතා තීරණාත්මක වේ.

1.1 රූප සටහන


## ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පැමිණීම




ලැබී ඇති ආර්ථික දර්ශකවලින් පෙනී යන පරිදි ශ්‍රී ලංකා ආර්ථිකයේ අංශ රාශියක් 2020 වසරේ තුන්වන කාර්තුව අවසාන වන විට, **දෙවන කාර්තුවේ මුහුණ දුන් පසුබෑමෙන් යථා තත්ත්වයට** පත් ව ඇත...
කෙසේ වුව ද, 2020 වසරේ ද ඔක්තෝබර් මාසයේදී කොවිඩ්-19 වසංගතය යළි ව්‍යාප්ත වීම තුළින් යථා තත්ත්වයට පත් වූ ආර්ථික ක්‍රියාකාරකම්වලට **අභියෝගයක් එල්ල විය හැකිය...**


රට පුරා සමාජ හා ආර්ථික කටයුතු සීමා කර පැවති කාලය තුළ පසුබෑමකට ලක් වුව ද, **කර්මාන්ත අංශය** 2020 වසරේ තුන්වන කාර්තුවේදී බොහෝ දුරට යථා තත්ත්වයට පත් විය...

### කාර්මික නිෂ්පාදන දර්ශකය




### ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (නිෂ්පාදන)






### සිමෙන්ති සැපයුම







### විදුලි උත්පාදනය




### අධිවේගී මාර්ගයේ වාහන ගමනාගමනය







වී නිෂ්පාදනය වැනි **කෘෂිකාර්මික අංශයේ** උප අංශ කිහිපයක් හිතකර නිෂ්පාදන තත්ත්ව වාර්තා කළේය...

### වී නිෂ්පාදනය





### තේ නිෂ්පාදනය




**වසංගතය නිසා ක්ෂණික බලපෑමකට ලක් වුව ද, සේවා අංශයේ බොහෝ ක්‍රියාකාරකම් 2020 වසරේ තුන්වන කාර්තුව වන විට වසංගතයට පෙර පැවති තත්ත්වයන්ට ළඟා විය...**


### ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සේවා)




### බහාලු මෙහෙයුම්





### පුළුල් කලාප දත්ත භාවිතය





සටහන: එක් පෙටා බයිටයක් (PB) ගිගා බයිට් (GB) මිලියනයකට සමාන වේ.

### ප්‍රවාහන අංශය සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කළ ඛනිජතෙල් අලෙවිය





**2020 වසරේ තුන්වන කාර්තුව තුළ දී අනෙකුත් සාර්ව ආර්ථික දර්ශකයන්ද සමස්තයක් ලෙස යථා තත්ත්වයට පැමිණ ඇති බව නිරීක්ෂණය කෙරිණි...**


### විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ





### අපනයන ඉපැයීම්




### පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)




### කොටස් වෙළඳපොල කාර්යසාධනය




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, කොළඹ කොටස් හුවමාරුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ අනෙකුත් කර්මාන්ත සහ සේවා පාර්ශවකරුවන්

1

## ආංශික වර්ධනයන්


### මූර්ත අංශය සහ උද්ධමනය

- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ රට තුළ සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීම හේතුවෙන් මතු වූ බාධා, වසංගත තත්ත්වය මධ්‍යයේ ගෝලීය ඉල්ලුම පහළ යෑම සහ අහිතකර කාලගුණික තත්ත්වවල සාමූහික බලපෑම පෙන්නුම් කරමින් 2020 වසරේ පළමු කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 1.6ක සංකෝචනයක් වාර්තා කළේය.[1] කෘෂිකාර්මික අංශය, 2019 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 5.0ක වර්ධනයට සාපේක්ෂව, 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 5.6ක සංකෝචනයක් වාර්තා කළේය. කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම් ද පසුගිය වසරේ පළමු කාර්තුවේ දී වාර්තා කළ සියයට 3.9ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 7.8කින් සංකෝචනය වී ඇත. වසංගත තත්ත්වය හේතුවෙන් සේවා අංශයට ඍජුවම ඇති වූ බලපෑම හමුවේ වුව ද, එම අංශය 2019 වසරේ පළමු කාර්තුව තුළ දී වාර්තා කළ සියයට 3.7ක වර්ධනයට සාපේක්ෂව, 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.1ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය.

- **ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව, කොවිඩ්-19 ව්‍යාප්තිය මධ්‍යයේ මාර්තු මස මැද භාගයේ සිට මැයි මස මැද භාගය දක්වා දීප ව්‍යාප්තව සමාජ හා ආර්ථික කටයුතු සීමා කර තැබීම, 2020 වසරේ මුල් භාගයේ දී අඩු ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතයකට සහ ඉහළ සේවා වියුක්ති අනුපාතයකට හේතු විය.** 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ සියයට 4.8 හා සැසඳීමේ දී, 2020 වසරේ මුල් භාගයේ දී සේවා වියුක්ති අනුපාතය, සියයට 5.6ක් දක්වා ඉහළ ගියේය. පුරුෂ සේවා වියුක්ති අනුපාතය, 2019 වසරේ මුල් භාගයේ පැවති සියයට 3.4ක සිට 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී සියයට 3.9ක් දක්වා ඉහළ ගිය අතර, ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ සියයට 7.2 සිට, සියයට 8.9ක් දක්වා ඉහළ ගියේය. වයස අවුරුදු 20-29 අතර වයස් කාණ්ඩයේ තරුණයන්ගේ සේවා වියුක්තිය පෙර වසරේ මුල් භාගයේ දී වාර්තා කළ සියයට 14.8 සිට, 2020 වසරේ මුල් භාගයේ දී සියයට 18.5ක් දක්වා ඉහළ ගියේය. තවද, අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ අධ්‍යාපනික සුදුසුකම් සහිත කාන්තාවන් අතර සේවා වියුක්තිය, 2019 වසරේ මුල් භාගයේ පැවති සියයට 12.3 සිට 2020 වසරේ මුල් භාගයේ දී සියයට 14.5ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී සියයට 52.6ක් වූ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 2020 වසරේ මුල් භාගයේ දී සියයට 50.6ක් දක්වා පහත වැටුණි. 2019 වසරේ මුල් භාගයේ දී සියයට 73.4ක් වූ පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය, 2020 වසරේ මුල් භාගයේ දී සියයට 72.1ක් දක්වා පහත වැටුණු අතර, පෙර වසරේ අනුරූප කාලයේ දී සියයට 34.7ක් වූ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය, 2020 වසරේ මුල් භාගයේ දී සියයට 32.0ක් දක්වා පහළ ගියේය. සමස්ත සේවා නියුක්තකයන්ගෙන් කෘෂිකර්මය, කර්මාන්ත සහ සේවා අංශ සඳහා වූ සේවා නියුක්ති දායකත්ව පිළිවෙළින්, සියයට 26.8ක්, සියයට 27.0ක් සහ 46.2ක් විය. කාර්තුමය ඇස්තමේන්තුවලට අනුව, 2020 වසරේ මුල්

**1.2 රූප සටහන**

**කාර්තුමය මූර්ත ද.දේ.නි.යෙහි වර්ධනය සඳහා දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


1 සමාජ සහ ආර්ථික කටයුතු සීමා කිරීම හේතුවෙන් දත්ත රැස් කිරීමට බාධා පැමිණීමත්, වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක වූ නිවසේ සිට වැඩ කිරීම, ගෙයින් ගෙට ගොස් සේවා සැපයීම වැනි නව ක්‍රියාකාරකම් ග්‍රහණය කර ගැනීමට සාම්ප්‍රදායික දත්ත රැස් කිරීමේ ක්‍රමවේද අපොහොසත් වීමත් හේතුවෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2020 වසරේ පළමු කාර්තුවේ ජාතික ගිණුම් ඇස්තමේන්තුවල සැලකිය යුතු මිනුම් දෝෂ පැවතිය හැකි ය. මෙම දෝෂ හේතුවෙන් 2020 වසරේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය අඩුවෙන් තක්සේරු වීමට බොහෝදුරට ඉඩ ඇති අතර, 2020 වසරේ අප්‍රේල් සහ මැයි මාසවලදී සමාජ හා ආර්ථික කටයුතුවලට සීමා පැනවීමේ බලපෑම අධික වීම නිසා, එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකය මන්දගාමී වීමේ සංඛ්‍යානමය නිරූපණය සත්‍ය තත්ත්වයට වඩා විශාල විය හැකිය. මෙම තත්ත්වය යටතේ, වසංගත සමයේ හඳුනාගත් ඇතැම් ක්‍රියාකාරකම්වල එකතු කළ අගය තක්සේරු කිරීමේ ක්‍රමවේදය පිළිබඳ වැඩිදුර සමාලෝචනයක් අවශ්‍ය බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිවේදනය කළ අතර, ඒ හේතුවෙන් 2020 වසරේ දෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාද කර ඇත.

භාගයේ දී සියයට 5.7ක් ලෙස ඇස්මේන්තු කරන ලද සේවා වියුක්ති අනුපාතය, 2020 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 5.4ක් දක්වා පහත වැටුණු අතර, දෙවැනි කාර්තුවේ දී ආර්ථික ක්‍රියාකාරකම් විශාල වශයෙන් පිරිහීමකට ලක් නොවී පැවතුණු බව එමගින් පිළිබිඹු කෙරිණි.

- **ආහාර උද්ධමනය නිතර ඉහළ යෑම මධ්‍යයේ වුව ද, අඩු ඉල්ලුම් තත්ත්ව සහ මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා, 2020 වසරේ මේ දක්වා කාලය තුළ දී උද්ධමනය සමස්තයක් වශයෙන් සියයට 4-6 පරාසය තුළ පවත්වා ගෙන යෑමට උපකාරී විය.** 2019 වසර අවසානයේ වාර්තා වූ සියයට 4.8ක සිට ආහාර උද්ධමනය හේතුවෙන් 2020 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 6.2ක් දක්වා ඉහළ ගිය කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, ආහාර උද්ධමනය ක්‍රමයෙන් අඩු වීමත්, හිතකර පදනම් බලපෑමත් හේතුවෙන් 2020 වසරේ සැප්තැම්බර් මාසය වන විට සියයට 4.0ක් දක්වා ක්‍රමයෙන් මන්දගාමී විය. ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය ද ඒ හා සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කළ නමුත්, එහි ආහාර කාණ්ඩය සඳහා ඉහළ බර තැබීමක් සිදු කර ඇති බැවින් එය සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2020 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 8.1ක උපරිමයක් දක්වා ඉහළ ගොස් 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 6.4 දක්වා මන්දගාමී විය. මේ අතර, උද්ධමනයේ යටිදැරි ප්‍රවණතාව පිළිබිඹු කරන මූලික උද්ධමනය අඩු ඉල්ලුම් තත්ත්ව හේතුවෙන් වසරේ මේ දක්වා කාලය තුළ දී පහළ මට්ටමක පැවතුණි. 2019 වසරේ දෙසැම්බර් මස සිට විදුලි සංදේශ බදු අඩු කිරීමත් සමඟ විදුලි සංදේශ හා දත්ත සේවාවන්ගේ මිල අඩු වීම මෙන්ම 2019 වසරේ දෙසැම්බර් සිට එකතු කළ අගය මත බද්ද අඩු කිරීම මූලික උද්ධමනය පහළ මට්ටමක පැවතීමට උපකාරී විය. ඒ අනුව, කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2019 වසර අවසානයේ වාර්තා වූ සියයට 4.8ක සිට 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 2.9ක් දක්වා මන්දගාමී වූ අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය 2019 වසර අවසානයේ වාර්තා වූ සියයට 5.2ක හා සැසඳීමේ දී 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 4.8ක් දක්වා මන්දගාමී විය.

**1.3 රූප සටහන**

**මතුපිට හා මූලික උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)**





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## විදේශීය අංශය

- **කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය ආරම්භ වීමත් සමඟ ඉහළ අවදානමකට මුහුණ දුන් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය, ඉන් පසුව මහ බැංකුවේ සහ රජයේ කාලෝචිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ආධාරයෙන් බොහෝදුරට යථා තත්ත්වයට පත් විය.** 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ භාණ්ඩ අපනයන පහත වැටීම අභිබවා භාණ්ඩ ආනයන විශාල වශයෙන් අඩු වීමේ බලපෑම පිළිබිඹු කරමින් 2019 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයට සාපේක්ෂව වෙළඳ ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩු විය. 2020 වසරේ මුල් කාලපරිච්ඡේදය තුළ දී නිරීක්ෂණය කළ මාසික අපනයන ඉපැයීම් අඩු වීම මැයි මාසයේ සිට යථා තත්ත්වයට පත් වීම ඇරඹුන අතර, එමගින් වසරේ තුන්වන කාර්තුවේ දී අපනයන ඉපැයීම්, සාමාන්‍යයක් ලෙස මාසයකට එ.ජ. ඩොලර් බිලියනයක මට්ටමක් දක්වා ළඟා විය. ප්‍රධාන වශයෙන් සංචාරක ඉපැයීම් අඩු වීම පිළිබිඹු කරමින් සේවා ගිණුමේ අතිරික්තය 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වෙතත්, සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීමේ කාලපරිච්ඡේදය තුළ තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ සමාගම් බාධාවකින් තොරව ක්‍රියාත්මක වීම නිසා පරිගණක සේවා අංශය අඛණ්ඩ ශක්තිමත් වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, 2019 වසරේ පළමු භාගයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,545ක් වූ සේවා ගිණුමේ අතිරික්තය 2020 වසරේ පළමු භාගයේ දී එ.ජ. ඩොලර් මිලියන 901ක් දක්වා අඩු විය.

1

**1.4 රූප සටහන**
**වෙළඳ ශේෂය සහ ජංගම ගිණුමේ ශේෂය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය, 2019 වසරේ පළමු භාගය තුළ වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,119ට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,041ක් දක්වා අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විදේශීය සෘජු ආයෝජනවල ප්‍රතිආයෝජිත ඉපැයීම් අඩු වීම, සෘජු ආයෝජන සමාගම් විසින් සිදු කළ ලාභාංශ ගෙවීම් සුළු වශයෙන් අඩු වීම සහ විදේශීය ණය සඳහා පොලී ගෙවීම් අඩු වීමයි. ද්විතීයික ආදායම් ගිණුමේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2019 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,270ක සිට 2020 වසරේ පළමු භාගයේ දී එ.ජ. ඩොලර් මිලියන 2,980ක් දක්වා සියයට 8.9කින් අඩු විය. කෙසේ වෙතත්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2020 වසරේ ජූනි මාසයේ සිට වේගයෙන් යථා තත්ත්වයට පත් වෙමින්, 2020 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 2.4ක වර්ධනයක් වාර්තා කළේය. කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය මධ්‍යයේ සංචාරක ඉපැයීම් සැලකිය යුතු ලෙස අඩු වීම සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මධ්‍යස්ථ වීම හේතුවෙන් විදේශීය ජංගම ගිණුමේ හිඟය 2019 වසරේ පළමු භාගය තුළ වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 351ට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී එ.ජ. ඩොලර් මිලියන 792ක් දක්වා සැලකිය යුතු ලෙස පුළුල් විය.

- **2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ දී වෙළඳ ගිණුමේ හිඟය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී අඩු වූ අතර, ආනයන වියදමෙහි පහත වැටීම අපනයන පහළ යෑම අභිබවා යෑම එයට හේතු විය.** වසරකට පෙර පැවති තත්ත්වය හා සැසඳීමේ දී ආනයන වියදමෙහි සහ අපනයන ආදායමෙහි සියලු ප්‍රධාන කාණ්ඩවල අඩු වීමක් 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී වාර්තා විය. ඒ අනුව, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 10,257ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 2,628කින් (සියයට 20.4කින්) අඩු වූ අතර, අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 6,445ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 1,585කින් (සියයට 19.7කින්) අඩු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අටක කාලපරිච්ඡේදය තුළ දී වෙළඳ හිඟය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,812ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 1,043කින් අඩු විය. ඛනිජ තෙල් සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම පහළ යෑම මෙන් ම, 2020 වසරේ මාර්තු මාසයේ සිට අත්‍යවශ්‍ය නොවන ආනයන මත පනවන ලද සීමා කිරීම්වල බලපෑම ද ආනයන වියදමෙහි අඩු වීම සඳහා දායක විය. කෙසේ වෙතත්, වසරකට පෙර තත්ත්වය හා සැසඳීමේ දී ආහාර හා පාන වර්ග සහ ඖෂධීය නිෂ්පාදිත ආනයන වියදම අදාළ කාලපරිච්ඡේදය තුළ දී ඉහළ ගියේය. ගෝලීය වශයෙන් ඉල්ලුම පහළ යෑමෙන් සහ සැපයුම් දාමයන්ට බාධා සිදු වීමෙන් 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ දී ඇඟලුම් (එ.ජ. ඩොලර් මිලියන 950කින්), තේ (එ.ජ. ඩොලර් මිලියන 109කින්) සහ රබර් නිෂ්පාදිත (එ.ජ. ඩොලර් මිලියන 102කින්) ඇතුළු ප්‍රධාන අපනයන භාණ්ඩ 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී පහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2020 වසරේ මැයි මාසයේ සිට මාසික අපනයන ආදායම සැලකිය යුතු අන්දමින් යථා තත්ත්වයට පත් වූ අතර, ඇඟලුම් සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඒ සඳහා දායක විය. තේ මිල ඉහළ යෑම මෙන්ම, පෞද්ගලික සනීපාරක්ෂක උපකරණ අපනයන ආදායම ඉහළ යෑම ද අපනයන ආදායමෙහි වර්ධනයට දායක විය. 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී ද අපනයන ආදායම අඛණ්ඩව යථා තත්ත්වයට පත් වෙමින් පවතින බව ලැබී ඇති තාවකාලික දත්ත මගින් පිළිබිඹු වේ.


- **ගෝලීය මූල්‍ය වෙළඳපොළ තුළ ආයෝජකයින් තුළ පවතින අපේක්ෂාවන් අඩු වීම සහ වසංගතය හමුවේ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම පිළිබිඹු කරමින් 2020 වසරේ මුල් භාගයේ දී මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.** 2020 මාර්තු මාසයේ දී චීන සංවර්ධන

බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 500ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම 2020 වසරේ මුල් භාගයේ දී මූල්‍ය ගිණුමේ වාර්තා වූ රජය වෙත ලැබුණු ප්‍රධාන ලැබීම විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන 2020 ජනවාරි සිට ජූනි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 492ක් සහ එ.ජ. ඩොලර් මිලියන 108ක ශුද්ධ ගෙවීම් වාර්තා කළේය. විදේශීය ණය ද ඇතුළත් විදේශ ආයෝජන, 2019 වසරේ මුල් භාගයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 535ක් සමඟ සැසඳීමේ දී 2020 වසරේ මුල භාගයේ දී එ.ජ. ඩොලර් මිලියන 345ක් ලෙස මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. රජය හා තැන්පතු භාර ගන්නා ආයතන වෙත වූ ශුද්ධ ණය ලැබීම හේතුවෙන්, පෙර වසරේ මුල් භාගයට සාපේක්ෂව 2020 වසරේ මුල් භාගයේ දී මූල්‍ය ගිණුම වෙත වූ විදේශීය ණය ලැබීම් ඉහළ ගියේය.

- **දළ නිල සංචිත, 2020 වසරේ සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී පහත වැටුණු නමුත්, ප්‍රමාණවත් මට්ටමක පැවතුණි.** 2019 වසර අවසානය වන විට වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 7.6ට සාපේක්ෂව 2020 වසරේ සැප්තැම්බර් මාසය අවසාන වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 6.7ක් විය. 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ දළ නිල සංචිත හා සම්බන්ධ ප්‍රධාන ලැබීම් තුළ චීන සංවර්ධන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 500ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම, එ.ජ. ඩොලර් මිලියන 670ක විදේශ මුදල් බැංකු ඒකකවලින් ලද ණය සහ ඉන්දියානු සංචිත බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 400ක දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළත් විය. මේ අතර, මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත විදේශ විනිමය මිලදී ගැනීම ද දළ නිල සංචිත මට්ටම කෙරෙහි බලපෑවේය. 2020 වසරේ සැප්තැම්බර් අවසානය වන විට පැවැති නිල සංචිත මාස 4.7ක ආනයන ආවරණය කර ගැනීමට තරම් ප්‍රමාණවත් විය. 2020 වසරේ ඔක්තෝබර් මස මුල දී මහ බැංකුව විසින් දළ නිල සංචිත භාවිතා කරමින් එ.ජ. ඩොලර් බිලියනයක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය පියවීම සඳහා පහසුකම් සලසන ලදී. දළ නිල සංචිත සහ බලපත්‍රලාභී බැංකුවල විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2019 වසර අවසාන වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 10.4ක සිට 2020 වසරේ අගෝස්තු මාසය අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 10.3ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණි. 2020 වසරේ අගෝස්තු මාසය අවසාන වන විට පැවති මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයන මාස 7.2කට සමාන විය.

**1.5 රූප සටහන**

**දළ නිල සංචිත සහ විනිමය අනුපාතිකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **රට තුළ කොවිඩ්-19 වසංගතය පැතිර යෑම ආරම්භ වීමත් සමඟ මාර්තු සහ අප්‍රේල් මාසවල දී විනිමය අනුපාතිකය තියුණු ලෙස අවප්‍රමාණය වුව ද, 2020 වසරේ මේ දක්වා කාලය තුළ දී විනිමය අනුපාතිකය බොහෝදුරට ස්ථාවරව පැවතුණි.** 2019 වසර අවසානය හා සැසඳීමේ දී 2020 වසරේ අප්‍රේල් මස 09 වන දින වන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල් 199.75ක් දක්වා සියයට 9.07කින් සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී විනිමය අනුපතිකයට ඇති පීඩනය ලිහිල් කිරීම සඳහා මහ බැංකුව විදේශ විනිමය ද්‍රවශීලතාවය සැපයීම ඔස්සේ විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වූ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ විකුණුම් මිලදී ගැනීමේ ක්‍රමවේදය යටතේ කෙටිකාලීන විදේශ විනිමය හුවමාරු ගිවිසුම් ක්‍රමයක් ක්‍රියාත්මක කළේය. තවද, අත්‍යවශ්‍ය නොවන ආනයන සහ රටින් පිටතට සිදු කෙරෙන විදේශ විනිමය ගෙවීම් සීමා කිරීමට, රජය සහ මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති පීඩනය අවම කර ගැනීමට සහ විනිමය අනුපාතිකය ස්ථාවර කර ගැනීමට උපකාරී විය. එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ද්‍රවශීලතා තත්ත්වයන් වැඩි වීම හේතුවෙන් වසරේ මේ දක්වා කාලය තුළ දී මහ බැංකුවට ශුද්ධ පදනම මත විදේශ විනිමය අවශෝෂණය කර ගැනීමට හැකි විය. ඒ අනුව, 2020 වසරේ ඔක්තෝබර් 23 දින වන විට, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අවප්‍රමාණය සියයට 1.4කට සීමා


1

විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 ඔක්තෝබර් 23 දින වන විට ශ්‍රී ලංකා රුපියල, යූරෝ (සියයට 6.4කින්), ජපන් යෙන් (සියයට 5.0කින්) සහ ස්ටර්ලින් පවුම් (සියයට 1.0කින්) යනාදී විදේශ මුදල්වලට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ඉන්දියානු රුපියලට (සියයට 1.8කින්) සාපේක්ෂව අතිප්‍රමාණය විය. අනෙකුත් ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතිකවල හැසිරීම සමඟ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි නාමික අවප්‍රමාණය පිළිබිඹු කරමින් 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සැදුම් ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික 2019 වසරේ අවසානයේ පැවති අගයන් හා සැසඳීමේ දී, පිළිවෙළින්, සියයට 2.69කින් සහ සියයට 1.09කින් අවප්‍රමාණය විය. මේ අතර නාමික විනිමය අනුපාතිකවල වෙනස්වීමට අමතරව උද්ධමන පරතරයන් ද සැලකිල්ලට ගෙන ගණනය කරනු ලබන මූර්ත සඵල විනිමය අනුපතිකය, 2019 වසරේ අවසානය හා සැසඳීමේ දී 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට, මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත පදනම්ව සියයට 0.61කින් අවප්‍රමාණය වූ අතර, මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම්ව සියයට 1.10කින් අතිප්‍රමාණය විය. මේ අතර, 2020 වසරේ සැප්තැම්බර් මස අග වන විට දී මූර්ත සඵල විනිමය අනුපාතික ද්විත්වයම දර්ශකාංක 100ට පහළින් පැවති අතර, පදනම් වර්ෂයට සාපේක්ෂව සමස්තයක් වශයෙන් මූර්ත සඵල විනිමය අනුපාතිකයන්ගේ අවප්‍රමාණය වීම එයින් පෙන්නුම් කෙරේ.

## රාජ්‍ය මූල්‍ය අංශය

- **දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් හේතුවෙන් 2020 වසර සඳහා ජාතික අයවැය ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම මධ්‍යයේ, 2020 වසරේ දී ගනු ලැබූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය පියවරවල අවධානය යොමු වූයේ කොවිඩ්-19 බලපෑම අවම කිරීම කෙරෙහිය.** 2019 වසරේ නොවැම්බර් මාසයේ පැවති ජනාධිපතිවරණයෙන් පසු වාර්ෂික අයවැයක් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම හේතුවෙන්, 2020 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ රාජ්‍ය මූල්‍ය කටයුතු, 2019 වසරේ ඔක්තෝබර් මාසයේ දී අනුමත කරන ලද අතුරු සම්මත ගිණුම (VoA) යටතේ සැලසුම් කරන ලදී. වාර්ෂික අයවැයක් හෝ අතුරු සම්මත ගිණුමක් අනුමත කර ගැනීමට පෙර 2020 මාර්තු 03 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද අතර, කොවිඩ්-19 ව්‍යාප්තිය මධ්‍යයේ මහ මැතිවරණය ප්‍රමාද වූ හෙයින්, අතිගරු ජනාධිපතිතුමා තමා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, මහජන සේවාවන් සඳහා ඒකාබද්ධ අරමුදලෙන් ප්‍රතිපාදන සැලසීය. 2020 වසරේ අගෝස්තු මස පැවති මහ මැතිවරණයෙන් අනතුරුව, 2020 වසරේ අගෝස්තු 28 වන දින පාර්ලිමේන්තුව විසින් වසරේ අවසාන මාස හතර ආවරණය වන පරිදි තවත් අතුරු සම්මත ගිණුමක් අනුමත කරන ලදී.[2] මේ අතර, 2019 වසරේ නොවැම්බරයේ පැවති ජනාධිපතිවරණයෙන් අනතුරුව දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති, ජනතාවගේ වැය කළ හැකි ආදායම් ඉහළ නැංවීම සහ ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය සඳහා සහාය වීම අරමුණු කරගත් ක්‍රියාමාර්ගවලට අමතරව, වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර සහ පුද්ගලයන්ට ආධාර කිරීම සඳහා රජය සානුබල පියවර කිහිපයක් ආරම්භ කළේය. ඒ අනුව, පුද්ගල හා සම්මත සංස්ථාපිත ආදායම් බදු අනුපාත අඩු කිරීම, ආදායම් බද්දෙහි බදු කාණ්ඩ මට්ටම් සහ බදු රහිත නිදහස් සීමාව වැඩි කිරීම සහ උපයන විට ගෙවීමේ බද්ද (PAYE), ආර්ථික සේවා ගාස්තු බද්ද (ESC) සහ රඳවා ගැනීමේ බදු (WHT) අතරින් බොහොමයක් අහෝසි කිරීම ඇතුළු ප්‍රධාන බදු සංශෝධන 2020 වසරේ ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලදී. තවද, තෝරාගත් සෞඛ්‍ය

**1.6 රූප සටහන**
**රාජ්‍ය ආදායම සහ වියදම (අ)**




මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව


(අ) 2020 වසර සඳහා වන දත්ත මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකථන මත පදනම් වේ.

2 2020 මුදල් වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත 2020 ඔක්තෝබර් 06 වන දින ගැසට් කරන ලදී. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (2) වගන්තිය යටතේ සම්මත කර ඇති සහ 150 (3) යටතේ බලය පවරන ලද යෝජනා යටතේ කරන ලද ඇතැම් වියදම් සහ අත්තිකාරම් 2020 සඳහා විසර්ජන පනතේ පළමු උපලේඛනයට, දෙවන උපලේඛනයට සහ තෙවන උපලේඛනයට ඇතුළත් කළ යුතු අතර, 150 (2) වගන්තිය යටතේ සම්මත කර ඇති යෝජනා අනුව කරන ලද ණය ගැනීම් 2020 සඳහා විසර්ජන පනතේ 2(1) (ආ) වගන්තිය යටතේ ඇතුළත් කළ යුතුය. 2021 මුදල් වර්ෂය සඳහා ද විසර්ජන පනත් කෙටුම්පත 2020 ඔක්තෝබර් 6 වන දින ගැසට් කරන ලදී.

ආශ්‍රිත උපකරණ ආනයන බද්දෙන් නිදහස් කිරීමට පියවර ගත් අතර, 2020 වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවලදී ගෙවා අවසන් කළ යුතු වූ රඳවා ගැනීමේ බද්ද, මුද්දර ගාස්තු සහ එකතු කළ අගය මත බදුවලට අදාළ, ගෙවීම් සිදු කළ යුතු අවසන් දිනය 2020 වසරේ අප්‍රේල් 30 වන දින දක්වා දීර්ඝ කරන ලදී. මේ අතර, කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් සමාජ හා ආර්ථික ක්‍රියාකාරකම් සීමා කරනු ලැබූ කාලය තුළ සියලුම බදු දඩ මුදල් ගෙවීමෙන් නිදහස් කළ අතර, ප්‍රමාද වූ ගෙවීම් සඳහා දඩ මුදල් අය කිරීමේ පටිපාටිය ආරම්භ වූයේ 2020 වසරේ ජූලි මාසයේ සිටය. තවද, 2018/2019 තක්සේරු වර්ෂය සඳහා නිකුත් කරන ලද තක්සේරු කිරීම් මත ආදායම් බදු හිඟ මුදල් නිදහස් කිරීම, 2019/2020 වර්ෂය සඳහා අතිරේක තක්සේරු නිකුත් නොකිරීම, හිඟ බදු ගෙවීම සඳහා සහන කාලයක් ලබා දීම, අත්පත් කර ගැනීමේ දැන්වීම් දීර්ඝ කිරීම සහ බදු වාර්තා ගොනු කිරීම හා බදු ගෙවීම් සඳහා දීර්ඝ කාල නියමයන් සැපයීම වැනි දෑ තුළින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට විවිධ බදු සහන ලබා දී ඇත. මේ අතර, විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට පියවර ගන්නා අතර ම, රජයේ සුභසාධන වැඩසටහන් ඔස්සේ කොවිඩ්-19 වසංගතය මගින් පීඩාවට පත් වූ සමාජයේ අගහිගකම් ඇති කොටස් සඳහා අඛණ්ඩව සහාය ලබා දෙන ලදී.

- **රජයේ ආදායම සහ වියදම කෙරෙහි වසංගතයේ බලපෑම සහ පෙර වසරේ දී නොපියවා ඉදිරියට ගෙන එන ලද බිල්පත් පියවීම යනාදිය පිළිබිඹු කරමින්, 2019 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ රාජ්‍ය මූල්‍ය අංශය අඩු කාර්යසාධනයක් වාර්තා කළේය.** 2020 වසරේ ජූලි මාසයෙන් අවසාන වූ මාස හත තුළ, ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ආදායම 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති සියයට 6.9ක සිට සියයට 4.9ක් දක්වා අඩු වූ අතර, කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තියෙන් පසු ආර්ථික ක්‍රියාකාරකම් අඩු වීම සහ බදු අනුපාතික අඩු කිරීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ආදායම් බදු, නිෂ්පාදන බදු, එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩ නැගීමේ බදු, වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බදු සහ සෙස් බදු යන ප්‍රධාන බදු කාණ්ඩවල ආදායම් එක් රැස් කිරීම පහත වැටීම තුළින් මෙලෙස ආදායමේ අඩු වීමක් දැකිය හැකි විය. කෙසේ වෙතත්, සලකා බලන කාලපරිච්ඡේදය තුළ බදු නොවන ආදායම පසුගිය වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව

### 1.7 රූප සටහන
### ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ (අ)




මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2020 වසර සඳහා වන දත්ත මහ බැංකුවේ ද.දේ.නි. පුරෝකථන මත පදනම් වේ.

රුපියල් බිලියන 92.8 දක්වා සියයට 6.1කින් වැඩි වූ අතර, 2019 වසරේ මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව, මහ බැංකුව විසින් රජය වෙත ප්‍රදානය කරන ලද රුපියල් බිලියන 24.0ක ලාභ පැවරුම් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. වියදම් අංශයෙන් ගත් කළ, පුනරාවර්තන වියදම් ඉහළ ගොස් තිබිය දී පවා, 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම්, ඇස්තමේන්තුගත ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති සියයට 11.4ක සිට සියයට 10.6ක් දක්වා අඩු වීම සඳහා ප්‍රාග්ධන වියදම් සැලකිය යුතු ලෙස පහත වැටීම හේතු විය. 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ පුනරාවර්තන වියදම්, 2019 වසරේ එම කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 8.9ක සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 9.4ක් දක්වා වැඩි වූ අතර, වැටුප් හා වේතන සහ සහනාධාර හා වර්තන පැවරුම් වැඩි වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ප්‍රාග්ධන වියදම් සඳහා ඇති සීමිත අවකාශය පිළිබිඹු කරමින් 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන් මෙන් ම, ඇස්තමේන්තුගත ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ද සැලකිය යුතු ලෙස පහත වැටුණි. එසේ වුව ද, රජයේ ආදායමේ අඩු වීම රජයේ වියදම්වල අඩු වීමට වඩා තියුණු වීම හේතුවෙන් 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ දී සමස්ත අයවැය හිඟය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පැවති සියයට 4.6 (රුපියල් බිලියන 684.1)ක සිට, ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.6 (රුපියල්

1

බිලියන 872.6)ක් දක්වා ඉහළ ගියේය. 2019 වසරේ සිට ගෙවීම් සිදු නොකර ඉදිරියට ගෙන එන ලද හිඟ බිල්පත් පියවීමට සිදු වීම මගින් රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සඳහා පීඩනයක් ඇති කළ අතර, එය පෙර වසරට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ අයවැය හිඟය පුළුල් වීමට දායක විය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ ප්‍රාථමික ශේෂය දුර්වල වූ අතර, එය 2019 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා වූ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.8ක හිඟයට සාපේක්ෂව, ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.9ක හිඟයක් ලෙස වාර්තා විය. එසේම, 2019 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදයේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.1ක් වූ රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන පුනරාවර්තන ගිණුමේ හිඟය, 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, සියයට 4.5ක් දක්වා ඉහළ ගියේය.

- **2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ අයවැය හිඟය දේශීය මූලාශ්‍ර ඔස්සේ මූල්‍යනය කර ඇති අතර, විදේශීය මූල්‍යනය ශුද්ධ ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය.** 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ දේශීය මූල්‍යනය මහ බැංකුව ද ඇතුළුව බැංකු අංශයෙන් ලබා ගන්නා ලද සැලකිය යුතු ණය ගැනීම්වලින් සමන්විත විය. 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ දී බැංකු අංශයෙන් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වූ රුපියල් බිලියන 170.9ක සිට රුපියල් බිලියන 867.0ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එහෙත්, 2020 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ බැංකු නොවන මූලාශ්‍රයන් හරහා සිදු කළ ශුද්ධ මූල්‍යනය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ රුපියල් බිලියන 400.5ක සිට රුපියල් බිලියන 200.0ක් දක්වා අඩු විය. මේ අතර, විදේශීය මූලාශ්‍රයන්ගෙන් සිදු කළ මූල්‍යනය, 2019 වසරේ පළමු මාස හත තුළ වාර්තා වූ රුපියල් බිලියන 112.7ක ශුද්ධ මූල්‍යනයට සාපේක්ෂව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 194.5ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් වශයෙන් වාර්තා විය. අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා වැඩි වශයෙන් ණය ලබා ගැනීමට සිදු වීමත්, අනෙකුත් බොහෝ මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ බලපෑමත් සමඟ, 2019 වසර අවසානය හා සසඳන විට 2020 වසරේ ජූලි මාසය අවසන් වන විට මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය රුපියල් බිලියන 14,261.0 දක්වා රුපියල් බිලියන 1,229.5කින් ඉහළ ගියේය. 2020 වසරේ ජූලි මාසය අවසන් වන විට මධ්‍යම රජයේ දේශීය හා විදේශීය ණය ප්‍රමාණය පිළිවෙළින්, රුපියල් බිලියන 7,708.0ක් සහ රුපියල් බිලියන 6,553.1ක් විය. 2020 වසරේ ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ සිදු කළ ණය සේවාකරණ ගෙවීම්, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව රුපියල් බිලියන 1,190.9ක් දක්වා සියයට 17.0කින් අඩු වූ අතර, 2019 වසරේ ගෙවීම් තුළ කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයකට අදාළ ආපසු ගෙවීම් ඇතුළත් විය. 2020 වසරේ දී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම පහත හෙළන ලද ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ඉස්මතු කරන ලද අහිතකර සමපේක්ෂණ අපේක්ෂා සහ අභියෝග හමුවේ වුව ද, 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ඇතුළු කල්පිරෙන සියලු ණය නියමිත ආකාරයෙන් පියවීමට රජය පියවර ගත්තේය.

## මුදල් අංශය

- **කොවිඩ්-19 වසංගතය පැතිරීම සහ එය පාලනය කිරීමට ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් ආර්ථිකයට වන බලපෑම අවම කිරීම සඳහා, අඩු උද්ධමන පීඩන තත්ත්ව සහ මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂාවල සහාය ඇතිව, 2020 වසරේ මේ දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව සැලකිය යුතු ලෙස මුදල් වෙළඳපොළ තත්ත්වයන් ලිහිල් කළ අතර, ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.** අඩු උද්ධමන වාතාවරණයක් තුළ පහළ මට්ටමක පවතින ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්කිරීමේ අරමුණින් 2019 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කිරීම ආරම්භ කළේය. කොවිඩ්-19 වසංගතය පැතිරයෑමෙහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථික ක්‍රියාකාරකම්වල සැලකිය යුතු පසුබෑමක් ඇති වූ අතර, වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සහ කුටුම්භයන්ට සහායවීමට සහ කඩිනමින් යථා තත්ත්වයට පත්වීම සහතික කිරීම සඳහා සැලකිය යුතු ප්‍රමාණයක ප්‍රතිපත්ති මැදිහත්වීම් අවශ්‍ය විය. ඒ අනුව, 2020 වසරේ ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පදනම් අංක 50 බැගින් අඩු කළේය. සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීම සහ එමගින් ආර්ථිකයට ඇති වූ බලපෑම හමුවේ ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික 2020

### සංඛ්‍යා සටහන 1.1
### 2020 වසරේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග (අ)

| දිනය | ක්‍රියාමාර්ගය |
|---|---|
| 2020 ජනවාරි 30 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 6.50% සහ 7.50% දක්වා අඩු කරන ලදී. |
| 2020 මාර්තු 17 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 6.25% සහ 7.25% දක්වා අඩු කරන ලදී. |
| 2020 මාර්තු 17 | 2020 මාර්තු මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1.00කින් 4.00% දක්වා අඩු කරන ලදී. |
| 2020 මාර්තු 27 | කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා 4.00% පොලී අනුපාතිකයක් යටතේ රුපියල් බිලියන 50ක් දක්වා වූ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම (ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය - පළමු අදියර) හඳුන්වාදෙන ලදී. |
| 2020 අප්‍රේල් 03 | 2020 අප්‍රේල් මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 6.00% සහ 7.00% දක්වා අඩු කරන ලදී. |
| 2020 අප්‍රේල් 16 | බැංකු අනුපාතිකය පදනම් අංක 500කින් 10.00% දක්වා අඩු කරනු ලැබූ අතර, පදනම් අංක +300 ආන්තිකයක් සහිතව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා අනුකූලව ස්වයංක්‍රීයව ගැළපීම සඳහා ඉඩ හරින ලදී. |
| 2020 මැයි 06 | 2020 මැයි 06 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.50% සහ 6.50% දක්වා අඩු කරන ලදී. බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 9.50% දක්වා අඩු විය. |
| 2020 ජූනි 16 | 2020 ජූනි මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.00කින්, 2.00% දක්වා අඩු කරන ලදී. |
| 2020 ජූනි 16 | කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා 2020 මාර්තු 27 හඳුන්වාදුන් 4.00% පොලී අනුපාතිකයක් යටතේ ලබා දුන් සහන ණය පහසුකම, රුපියල් බිලියන 150ක් දක්වා ඉහළ නංවන ලදී. (සෞභාග්‍යා පුනරුද සහන ණය පහසුකම - දෙවන අදියර) |
| 2020 ජූලි 09 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 4.50% සහ 5.50% දක්වා අඩු කරන ලදී. ඒ අනුව, බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 8.50% දක්වා අඩු විය. |

සටහන: ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 අප්‍රේල් 27 දින බලපත්‍රලාභී බැංකුවල උකස් පහසුකම මත උපරිම පොලී අනුපාතික සීමා පැනවූ අතර, 2020 අගෝස්තු 24 දින තෝරාගත් ණය උපකරණ මත පනවා තිබූ උපරිම සීමා තවදුරටත් අඩු කරන ලදී.

(අ) 2020 ඔක්තෝබර් 23 වැනි දින දක්වා

*මූලය:* ශ්‍රී ලංකා මහ බැංකුව

මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල අවස්ථා තුනක දී පදනම් අංක 100කින් තවදුරටත් අඩු කළේය. මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග ගණනාවකට ප්‍රතිචාර වශයෙන් වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වූ අතර, ණය පොලී අනුපාතික පහළ යෑම අපේක්ෂිත ප්‍රමාණයට සිදු නොවීය. එමනිසා, 2020 වසරේ ජූලි මස මුල දී මහ බැංකුව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, මෙතෙක් වාර්තා වූ අවම අගයන් දක්වා එනම්, පිළිවෙළින්, සියයට 4.50 සහ සියයට 5.50 දක්වා, පදනම් අංක 100 බැගින් අඩු කළේය. තව ද, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලිය කඩිනම් කිරීමට සහ ආන්තික ණය ගැණුම්කරුවන්ට සහන සැලසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය කාඩ්පත්, උකස් පහසුකම්, පෙර ගිවිසගෙන ඇති තාවකාලික බැංකු අයිරා මෙන් ම දඩ පොලී අනුපාතික මත උපරිම පොලී අනුපාතික සීමා පනවන ලදී. ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව, වාණිජ බැංකු සතු සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2020 මාර්තු සහ ජූනි මාසවල දී පියවර දෙකකින් සියයට 2.00 දක්වා ප්‍රතිශතාංක 3.0කින් පහළ දමනු ලැබූ අතර, එමගින් විශාල ද්‍රවශීලතාවක් දේශීය මුදල් වෙළඳපොළට මුදා හරින ලදී. මීට අමතරව, හදිසි අරමුදල් අඩු පොලී අනුපාතික යටතේ ලබා ගත හැකි බව පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව, 2020 අප්‍රේල් මාසයේ දී බැංකු අනුපාතිකය පදනම් අංක 500කින් අඩු කළ අතර, එය නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයට වඩා පදනම් අංක 300ක ආන්තිකයක් සහිතව ස්වයංක්‍රීයව ගැළපීමට ඉඩ සලසන ලදී. ඒ අනුව, 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට බැංකු අනුපාතිකය සියයට 8.50ක් දක්වා පදනම් අංක 650කින් අඩු විය. මේ අතර, රජයේ ඉල්ලීම පරිදි, කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ ඇති වූ සුවිශේෂී තත්ත්වය හේතුවෙන් වූ රජයේ අරමුදල් අවශ්‍යතාව 2020 වසරේ මේ දක්වා කාලය තුළ දී ප්‍රාථමික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම ඔස්සේ සපුරාලීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කළේය. තව ද, මුදල් නීති පනතේ විධිවිධානයන්ට අනුව, ආර්ථිකයේ අවශ්‍ය අංශවලට, විශේෂයෙන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට වාර්ෂිකව සියයට 4ක ඉතා සහනදායී පොලී අනුපාතයකට මූල්‍ය පහසුකම් සැපයීම සඳහා විශේෂ ණය යෝජනා ක්‍රම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමනය සහ උද්ධමන අපේක්ෂා සියයට 4-6 පරාසයක පවත්වා ගනිමින් මහ බැංකුව විසින් මෙම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගනු ලැබීය.


- **ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ දැමීම සහ දේශීය මුදල් වෙළඳපොළේ පවත්වා ගෙන යනු ලබන අතිරික්ත ද්‍රවශීලතාවයට ප්‍රතිචාර වශයෙන්, 2020 වසරේ මේ දක්වා කාලය තුළ දී, වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු විය.** බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අඩු වූ අතර, 2020 වසරේ ජූනි මස මැද භාගයේ

1

සිට ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාවේ පැවතුණි. රජය දේශීය මූලාශ්‍රයන්ගෙන් ණය ගැනීම් වැඩි කිරීම සහ වෙළඳපොළ තුළ පැවති අහිතකර අපේක්ෂා හේතුවෙන් 2020 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී පවත්වන ලද වෙන්දේසිවල දී ඵලදා අනුපාතික යම් ඉහළ යෑමක් පෙන්නුම් කළ ද, 2020 වසරේ මේ දක්වා කාලය තුළ දී ප්‍රාථමික වෙළඳපොළ රාජ්‍ය සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ද සැලකිය යුතු ලෙස පහළ ගියේය. ප්‍රාථමික වෙළඳපොළ සියලු ම කල්පිරීම් සඳහා වන ඵලදා අනුපාතිකවල පහළ යෑම පිළිබිඹු කරමින්, රාජ්‍ය සුරැකුම්පත් සඳහා වන ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය ද 2019 වසර අවසානය හා සැසඳීමේ දී 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට සැලකිය යුතු ලෙස පහළට විතැන් විය. පුළුල් වශයෙන් සිදු කළ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින්, 2020 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ තැන්පතු පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් තැන්පතු උපකරණ සඳහා සෘණාත්මක මූර්ත ප්‍රතිලාභ ලැබී ඇත. මේ අතර, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ දී වෙළඳපොළ ණය අනුපාතිකවල පහළ යෑම ක්‍රමයෙන් වේගවත් විය. ඒ අනුව, සතිපතා ගණනය කරනු ලබන බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය මෙතෙක් වාර්තා වූ අවම අගය දක්වා පහළ ගිය අතර, 2019 වසර අවසානය හා සැසඳීමේ දී නව ණය පොලී අනුපාතිකවල ද සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි.

**1.8 රූප සටහන**

**තෝරාගත් පොලී අනුපාතිකවල හැසිරීම**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **සංචිත මුදල් 2020 වසරේ අප්‍රේල් මස මැද තෙක් ක්‍රමයෙන් ඉහළ ගොස් උපරිමයක් වාර්තා කළ අතර, ඉන්පසුව 2020 වසරේ ජූනි මාසයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු ලෙස පහළ ගියේය.** උත්සව සමය ළඟා වීමත් සමඟ 2020 වසරේ මුල් කාලයේ දී සංචිත මුදල් ක්‍රමයෙන් ඉහළ ගිය ද, 2020 වසරේ මාර්තු මාසයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීමත් සමඟ යම් මට්ටමකට අඩු විය. කෙසේ වුව ද, දේශීය වශයෙන් කොවිඩ්-19 වසංගතය පැතිර යෑමත් සමඟ ඇති වූ අවිනිශ්චිතතා හේතුවෙන් ආරක්ෂණ පිළිවෙතක් ලෙස මුදල් සඳහා ඉල්ලුම ඉහළ ගිය අතර, ඒ හේතුවෙන් සංචිත මුදල් 2020 අප්‍රේල් මස මැද දක්වා ශීඝ්‍රයෙන් ඉහළ ගියේය. වෙළඳපොළ පොලී අනුපාතික පහළ මට්ටමක පැවතීමත් සමඟ මුදල් ළඟ තබා ගැනීමේ ආවස්ථික පිරිවැය අඩු වීම මෙන්ම, වසංගතය හමුවේ සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් නැවතත් බැංකු පද්ධතිය තුළට පැමිණීම අපේක්ෂිත මට්ටමට වඩා මන්දගාමී වීම හේතුවෙන් 2020 වසරේ ජූනි මස මැද වන තෙක් සංචිත මුදල් ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වුවද, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීමත් සමඟ ඉන් අනතුරුව සංචිත මුදල් සැලකිය යුතු ලෙස පහළ ගියේය. ඒ අනුව, 2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලය තුළ දී සංචිත මුදල් රුපියල් බිලියන 52.8කින් අඩු වූ අතර, එය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.7ක සංකෝචනයකි. වත්කම් අනුව සලකා බැලීමේ දී, 2020 වසරේ ජනවාරි මාසයේ සිට අගෝස්තු දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් රුපියල් බිලියන 20.8කින් වැඩි වීම ඉක්මවා ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 73.6කින් අඩු වීම මෙම කාලය තුළ දී සංචිත මුදල් අඩු වීම සඳහා මුළුමනින්ම හේතු විය. විදේශ මූල්‍ය වගකීම් වැඩි වීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් අඩු වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම කෙරෙහි රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණය වැඩි වීම මෙන් ම, වසංගත තත්ත්වය මධ්‍යයේ ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය යටතේ සහනදායී ණය ලබා දීමත් සමඟ වාණිජ බැංකු වෙත මහ බැංකුව ලබා දුන් ණය ප්‍රමාණය ඉහළ යෑම ද ප්‍රධාන වශයෙන් හේතු විය.

- **රාජ්‍ය අංශය වෙත සපයන ලද ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම්වල ඇති වූ වර්ධනයත් සමග 2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී පුළුල් මුදල් ($M_{2b}$) සැපයුමේ වර්ධනය අඛණ්ඩව ඉහළ ගියේය.** ඒ අනුව, පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2019 වසර අවසානයේ දී පැවති සියයට 7.0ට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 17.5ක් දක්වා ඉහළ ගියේය. බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් රුපියල් බිලියන 1,164.5කින් ඉහළ යෑම 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී සමස්ත මුදල් වර්ධනයට දායක වූ අතර, බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් සලකා බලන කාලසීමාව තුළ දී රුපියල් බිලියන 96.6කින් අඩු විය. මෙම කාලය තුළ දී ශුද්ධ දේශීය වත්කම්වල ඇති වූ සැලකිය යුතු වර්ධනය සඳහා බැංකු පද්ධතිය විසින් රජයට සපයන ලද ශුද්ධ ණය මෙන් ම, රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය ප්‍රමාණය ඉහළ යෑමත් හේතු විය. බැංකු පද්ධතිය විසින් රජයට සපයන ලද ශුද්ධ ණය පසුගිය වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී වාර්තා වූ රුපියල් බිලියන 235.3ක ඉහළ යෑමට සාපේක්ෂව 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී රුපියල් බිලියන 1,014.1කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. විදේශ මූල්‍ය ප්‍රවාහ ලැබීම් සීමිත වීම සහ රජයේ ආදායම් එක්රැස් කිරීම අඩු වීම මධ්‍යයේ දේශීය මූල්‍යකරණය කෙරෙහි රජය වැඩි වශයෙන් යොමු වීම 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී රජයට සපයන ලද ශුද්ධ ණය පෙර නොවූ අයුරින් ඉහළ යෑමට හේතු විය. වසංගත තත්ත්වය හේතුවෙන් තවදුරටත් දුර්වල වූ මූල්‍ය තත්ත්ව පිළිබිඹු කරමින් රජය සතු වාණිජ ව්‍යාපාර වෙත බැංකු පද්ධතිය විසින් ලබා දුන් ණය 2019 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී වාර්තා වූ රුපියල් බිලියන 8.5ක ශුද්ධ ආපසු ගෙවීමට සාපේක්ෂව 2021 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී රුපියල් බිලියන 205.0කින් ඉහළ ගියේය. 2020 වසරේ ජූලි මාසය දක්වා අඩු මට්ටමක පැවති පෞද්ගලික අංශයට සපයන ලද ණය, අඩු ණය පොලී අනුපාතික මෙන් ම, සහනදායී ණය යෝජනා ක්‍රම හරහා ලබා දුන් ණය හේතුවෙන් අගෝස්තු මාසයේ දී සැලකිය යුතු ලෙස වර්ධනයක් පෙන්නුම් කළේය. ඒ අනුව, පෞද්ගලික අංශයට සපයන ලද ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2019 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 4.3ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 5.2ක් දක්වා ඉහළ ගියේය. පෞද්ගලික අංශයට සපයන ලද මුළු ණය ප්‍රමාණය 2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී රුපියල් බිලියන 110.6කින් ඉහළ ගියේය. 2020 වසරේ සැප්තැම්බර් මාසය තුළ දී ද පෞද්ගලික අංශයට සපයන ලද ණය යහපත් වර්ධනයක් වාර්තා කර ඇති බව මූලික ඇස්තමේන්තු මගින් පෙන්නුම් කෙරේ.

**1.9 රූප සටහන**

**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### මූල්‍ය අංශය

- **කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා දේශීය සහ ගෝලීය වශයෙන් ආර්ථිකයට එල්ල වූ බාධක සහ අභියෝගාත්මක ව්‍යාපාර වාතාවරණයන් හමුවේ මූල්‍ය අංශය ශක්තිමත්ව පැවතුණි.** ප්‍රධාන වශයෙන් ම, තැන්පතු ලබාගැනීම මගින් සම්පාදනය කරගත් අරමුදල් මගින් සිදු කළ ණය හා අත්තිකාරම් සහ ආයෝජනවල ඉහළ යෑම හේතුවෙන් බැංකු අංශයේ වත්කම් පදනමේ මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා විය. බැංකු අංශයේ අක්‍රීය ණය ප්‍රමාණය ඉහළ යෑමේ ප්‍රවණතාවය ණය අවදානම් කළමනාකරණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණක් වශයෙන් පැවතුණි. ඉහළ ණය අවදානමක් මධ්‍යයේ වුව ද, ප්‍රමාණවත් ප්‍රාග්ධන, ද්‍රවශීලතා සහ ප්‍රතිපාදන ආවරණ සමගින් බැංකු අංශයේ කටයුතු ක්‍රියාත්මක විය. 2020 අගෝස්තු මාසයෙන් අවසන් වූ පළමු මාස අට තුළ දී බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් අංශයේ අඩු කාර්යසාධනයක් වාර්තා විය. මෙම අංශයේ මන්දගාමීත්වය, වත්කම්, ණය සහ තැන්පතු අඩු වීම තුළින් මෙන් ම, අක්‍රීය ණය ඉහළ යෑම සහ ලාභදායීත්වය පහළ යෑම තුළින් පිළිබිඹු විය. මූල්‍ය අංශයේ අනෙකුත් උප අංශ වන රක්ෂණ සහ

1

අර්ථසාධක අරමුදල් වැනි ක්ෂේත්‍ර මෙම කාලය තුළ දී මිශ්‍ර කාර්යසාධනයක් වාර්තා කළ අතර, කොවිඩ්-19 වසංගත ව්‍යාප්තියේ අහිතකර බලපෑම්වලට ලක්ව තිබූ කොටස් වෙළඳපොළ, 2020 මැයි මාසයේ සිට යථා තත්ත්වයට පැමිණෙන ලකුණු පෙන්නුම් කළේය. මේ අතර, කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීම මධ්‍යයේ වුව ද ආර්ථිකයේ ගනුදෙනු සඳහා පහසුකම් සලසමින් ගෙවීම් සහ පියවීම් පද්ධති අඛණ්ඩව ක්‍රියාකාරී විය.

### ජාත්‍යන්තර ආර්ථික වාතාවරණය

- **කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ ගෝලීය ආර්ථිකය හා මූල්‍ය වෙළඳපොළවල අවිනිශ්චිතතා ඉහළ ගිය අතර, 2020 වසරේ මේ දක්වා ගෝලීය ක්‍රියාකාරකම්හි තියුණු සංකෝචනයක් සිදුවීමට එය බලපා ඇත.** ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) විසින් 2020 ඔක්තෝබර් මාසයේ දී ප්‍රකාශයට පත් කළ ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook-WEO) අනුව 2019 වසරේ දී වාර්තා වූ සියයට 2.8ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී ගෝලීය ආර්ථිකය සියයට 4.4කින් සංකෝචනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ගෝලීය ආර්ථිකය 2021 වසරේ දී සියයට 5.2ක් දක්වා යළිත් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, ඉන් පසුව එය මධ්‍යස්ථ අගයක පවතිනු ඇත.

- **ගෝලීය වශයෙන්, රජයයන් විසින් පෙර නොවූ විරූ මට්ටම්වලින් වියදම් දැරීම් සහ මහ බැංකු විසින් මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීම මගින්, ප්‍රධාන ආර්ථිකයන්හි ආදායම් හා සේවා නියුක්තියට සහාය වීම සහ 2020 වසර තුළ දී ආර්ථිකයන් විශාල ලෙස සංකෝචනය වීම අඩු කර ගැනීමටත් උපකාරී විය.** ආර්ථිකයන් ක්‍රමයෙන් යළි විවෘත කිරීමත් සමඟ, 2020 වසරේ මැයි සහ ජූනි මාසයන්හි ක්‍රියාකාරකම් ඉහළ ගිය අතර, බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින් විශාල වශයෙන් පුනර්ජීවනය කිරීම සඳහා මහා පරිමාණ ප්‍රතිපත්තිමය සානුබල ආර්ථිකයන්ට උපකාරී විය. එක්සත් ජනපදයේ දළ දේශීය නිෂ්පාදිතය 2020 වසරේ පළමු කාර්තුවේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 5.0කින් සංකෝචනය වීමෙන් පසුව, 2020 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 31.4කින් සංකෝචනය විය. 2020 වසරේ පළමු කාර්තුවේ දී එක්සත් රාජධානියේ ආර්ථිකය පසුගිය වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2.5ක සංකෝචනය වීමක් වාර්තා කළ අතර, 2020 වසරේ දෙවන කාර්තුවේ දී එය සියයට 19.8කින් සංකෝචනය විය. 2020 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.7ක සංකෝචනයකින් පසුව යුරෝ කලාපයේ ආර්ථිකය 2020 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 11.8කින් තවදුරටත් සංකෝචනය විය. සාධනීය කරුණක් ලෙස, පෙර වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුව තුළ දී සංකෝචනයක් වාර්තා කළ චීනය, කොවිඩ්-19 වසංගතයේ බලපෑමෙන් මිදීමත් සමඟ, 2020 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 6.8ක සංකෝචනයට සාපේක්ෂව 2020 වසරේ දෙවන කාර්තුවේ දී යහපත් ප්‍රගතියක් පෙන්නුම් කරමින් සියයට 3.2ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, චීන ආර්ථිකයේ වර්ධනය වේගවත් වෙමින් 2020 වසරේ තුන්වන කාර්තුවේ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.9ක ද.දේ.නි.යෙහි වර්ධනයක් වාර්තා කර ඇත. 2020 වසරේ පළමු කාර්තුවේ දී ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.1ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළ ඉන්දියානු ආර්ථිකය, කොවිඩ්-19 වසංගතය ඉන්දියාව තුළ වේගවත් ලෙස පැතිර යෑමේ බලපෑම පිළිබිඹු කරමින්, 2020 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 23.9ක දැඩි සංකෝචනයකට ලක් විය. වසරේ මුල් භාගය තුළ දී නැගී එන වෙළඳපොළ ආර්ථික බොහොමයක ආර්ථික ක්‍රියාකාරකම් පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව තියුණු පහත වැටීමක් වාර්තා කළේය.

- **ගෝලීය ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් වීමේ ඇතැම් සලකුණු හමුවේ වුව ද, එම යථා තත්ත්වයට පත්වීම කල්ගතවන, අවිනිශ්චිත සහ ආර්ථිකයන් අතර අසමාන ලෙස සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ඒ අනුව, දියුණු ආර්ථිකයන් 2020 වසරේ දී සියයට 5.8කින් සංකෝචනය වනු ඇතැයි ද, 2021 වසරේ දී සියයට 3.9කින් වර්ධනය වනු ඇතැයි ද පුරෝකථනය කෙරේ. චීනය ඇතුළු නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 2020 වසරේ දී සියයට 3.3කින් සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, 2021 වසර සඳහා සියයට 6.0ක ශක්තිමත් වර්ධනයක් පුරෝකථනය කර ඇත. 2020 වසරේ දී වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂිත එකම ප්‍රධාන ආර්ථිකය වශයෙන් චීනය වසර තුළ දී සියයට 1.9කින් වර්ධනයක් වනු ඇතැයි ද, 2021 වසරේ දී සියයට 8.2ක වර්ධනයක් වාර්තා කරනු ඇතැයි ද යන පුරෝකථන සමඟින් චීනය සඳහා වූ වර්ධන අපේක්ෂාවන් ශක්තිමත්ව පැවතුණි. 2020 වසරේ දී ඉන්දියාවේ ආර්ථිකය සියයට 10.3කින් සංකෝචනය වනු ඇතැයි ද, 2021 වසරේ දී සියයට 8.8කින් වර්ධනය වනු ඇතැයි ද පුරෝකථනය කර ඇත.

- **ගෝලීය වශයෙන් වූ පුළුල් ප්‍රතිපත්තිමය සහයෝගය, මේ දක්වා ලෝක ආර්ථික ක්‍රියාකාරකම් යම් දුරකට නැවත යථා තත්ත්වයට පත් කිරීමට උපකාරී විය.** දියුණු ආර්ථික, ස්වකීය අභිමතය පරිදි, ආදායම් සහ වියදම් ක්‍රියාමාර්ග මෙන් ම, හිමිකම් සැපයීම්, වත්කම් මිලදී ගැනීම්, ණය සහ ණය ඇපකර ඇතුළු විවිධාකාර ද්‍රවශීලතා සහයෝගයන් සමඟ ප්‍රතිචාර දැක්වීය. නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික ද, ඇතැම් ආර්ථිකයන්හි පවතින සීමිත ප්‍රතිපත්ති අවකාශයක් මධ්‍යයේ වුව ද, ස්වයකීය අභිමතය පරිදි සැලකිය යුතු ප්‍රමාණයක අයවැය ආශ්‍රිත ක්‍රියාමාර්ග සමඟ ප්‍රතිචාර දැක්වීය. මේ අතර, ලෝකයේ විවිධ ප්‍රදේශවල ගනු ලැබූ ප්‍රතිපත්තිමය පියවර ද, පාර්ශ්වකරුවන් අතර විශ්වාසය ඉහළ නැංවීමට ඉවහල් විය. නිදසුනක් ලෙස, යුරෝපා සංගමය විසින් වසංගත ප්‍රතිසාධන අරමුදලක් ආරම්භ කළ අතර, වෙනත් බොහෝ රටවල්, පීඩාවට පත් ආයතන සහ කුටුම්භ සඳහා මුදල් සහ භාණ්ඩ හා සේවා පැවරුම්, වැටුප් සහනාධාර, පුළුල් කළ විරැකියා රක්ෂණ ආවරණය, බදු සම්බන්ධ නීති ලිහිල් කිරීම යනාදිය ලබා දී ඇත. දියුණු ආර්ථිකයන්හි මහ බැංකු විසින් ගනු ලැබූ පියවරයන් අතර, ප්‍රතිපත්ති අනුපාතික විශාල වශයෙන් අඩු කිරීමට අමතරව, වඩා විවිධාංගීකරණය වූ මහා පරිමාණ වත්කම් මිලදී ගැනීම් සහ ප්‍රතිමූල්‍යකරණ පහසුකම් ඇතුළත් විය. එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් ඉදිරි කාලයේ සියයට 2ක නම්‍යශීලී සාමාන්‍ය උද්ධමන ඉලක්කයක් කරා යොමු වීම සඳහා සිය මුදල් ප්‍රතිපත්ති උපායමාර්ග වෙනස් කිරීමට ලක් කරමින් අඩු පොලී අනුපාත පවත්වා ගැනීම පිළිබඳ ඉදිරි මග පෙන්වීමක් ද සිදු කළේය. නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි මහ බැංකුවල ප්‍රතිචාර ප්‍රධාන වශයෙන් පොලී අනුපාත අඩු කිරීම, නව ප්‍රතිණය දීමේ පහසුකම් සහ වත්කම් මිලදී ගැනීම්වලින් සමන්විත විය. මෙම ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්ට ප්‍රතිචාර දක්වමින් ගෝලීය ආර්ථික හා මූල්‍ය තත්ත්වයන් 2020 වසරේ ජූනි මාසයේ සිට යම් වර්ධනයක් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත්, මෑත මාසවල දී ගෝලීය වශයෙන් කොවිඩ්-19 දෙවන රැල්ල ඇතිවීම හේතුවෙන් අවදානම් තත්ත්වය යළිත් මතු වී ඇති බව පෙනේ.

- **කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ ඇති වූ සැපයුම් බාධාවන් හේතුවෙන් පැන නැගුණු මිල පීඩන මධ්‍යයේ වුව ද, සමාහාර ඉල්ලුම් තත්ත්වයන් අඩුවීම හේතුවෙන් ගෝලීය උද්ධමනය මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.** දියුණු ආර්ථිකයන්හි උද්ධමනය, දිගින් දිගට ම වසංගත තත්ත්වයට පෙර තිබූ මට්ටම්වලට වඩා අඩු මට්ටම්වල පැවතුණි. මේ අතර, වසංගතය සීඝ්‍ර ලෙස පැතිරීමත් සමඟ නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි උද්ධමනය තියුණු ලෙස අඩු විය. කෙසේ වෙතත්, සැපයුම් බාධාවන් හේතුවෙන් ආහාර මිල ඉහළ යෑම පිළිබිඹු කරමින් සමහර රටවල උද්ධමනය වේගවත් විය. දියුණු ආර්ථික කාණ්ඩයේ පාරිභෝගික උද්ධමනය 2021 වසරේ දී සියයට 1.6කට වැඩි වීමට පෙර, 2020 වසරේ දී සියයට 0.8ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. නැගී එන වෙළඳපොළවල සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි උද්ධමනයන් 2020 වසරේ දී සියයට

**1.2 සංඛ්‍යා සටහන**

**තෝරාගත් මහ බැංකුවල ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල වෙනස්වීම්**

සියයට

| රට | ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතිකය | 2017 අවසානයේදී | 2018 අවසානයේදී | 2019 අවසානයේදී | 2020 ඔක්. 23 වැනි දිනට |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.25 | 8.00 | 7.00 | 4.50 |
| | නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.75 | 9.00 | 8.00 | 5.50 |
| නැගී එන ආර්ථික | | | | | |
| ඉන්දියාව | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | 6.00 | 6.50 | 5.15 | 4.00 |
| මැලේසියාව | එක්දින ප්‍රතිපත්ති අනුපාතිකය | 3.00 | 3.25 | 3.00 | 1.75 |
| තායිලන්තය | එක්දින ද්විපාර්ශ්වික ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | 1.50 | 1.75 | 1.25 | 0.50 |
| චීනය | එක් අවුරුදු ප්‍රමුඛ ණය අනුපාතිකය | 4.35 | 4.35 | 4.15 | 3.85 |
| ඉන්දුනීසියාව | සත් දින ප්‍රතිවිකුණුම් අනුපාතිකය | 4.25 | 6.00 | 5.00 | 4.00 |
| පිලිපීනය | එක්දින ප්‍රතිවිකුණුම් අනුපාතිකය | 3.00 | 4.75 | 4.00 | 2.25 |
| දියුණු ආර්ථික | | | | | |
| ඇමෙරිකා එක්සත් ජනපදය | ෆෙඩරල් අරමුදල් අනුපාතිකය | 1.25-1.50 | 2.25-2.50 | 1.50-1.75 | 0.00-0.25 |
| එක්සත් රාජධානිය | බැංකු අනුපාතිකය | 0.50 | 0.75 | 0.75 | 0.10 |
| යුරෝපා මහ බැංකුව | ප්‍රතිමූල්‍යන අනුපාතිකය | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| ජපානය | එක්දින ඒක්ෂණ අනුපාතිකය | -0.10 | -0.10 | -0.10 | -0.10 |
| කැනඩාව | එක්දින අනුපාතිකය | 1.00 | 1.75 | 1.75 | 0.25 |
| ඕස්ට්‍රේලියාව | මුදල් අනුපාතිකය | 1.50 | 1.50 | 0.75 | 0.25 |
| ස්වීඩනය | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | -0.50 | -0.50 | -0.25 | 0.00 |

මූලයː අදාළ මහ බැංකුවල වෙබ් අඩවි

5.0ක් සහ 2021 වසරේ දී සියයට 4.7ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. කොවිඩ්-19 වසංගතය හමුවේ ගෝලීය වෙළඳපොළවල රත්‍රන් වත්කම් රැස්කිරීමේ සුරක්ෂිත මාධ්‍යයක් ලෙස අඛණ්ඩව පවතිණු දක්නට ලැබුණි. ඒ අනුව, ජාත්‍යන්තර රත්‍රන් මිල ගණන් වසර තුළ දී ඉහළ ගිය අතර, 2020 වසරේ අගෝස්තු මස පළමු සතිය තුළ දී අවුන්සයකට එ.ජ. ඩොලර් 2,000ක සීමාව පසු කිරීමෙන් අනතුරුව පහළ ගොස් ඉන්පසු 2020 වසරේ ඔක්තෝබර් මැද වන විට අවුන්සයකට එ.ජ. ඩොලර් 1,898ක මට්ටමක පැවතුණි. සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීම සහ සංචරණය අවහිර කිරීම හේතුවෙන් ඉල්ලුම ශීඝ්‍ර ලෙස අඩු වීම මධ්‍යයේ දැඩි ලෙස පහත වැටුණු බොරතෙල් මිල, 2020 වසරේ මැයි සිට ක්‍රමයෙන් ඉහළ යැමක් පෙන්නුම් කළේය. 2020 වසරේ අප්‍රේල් අවසානයේ දී බැරලයක් එ.ජ. ඩොලර් 13.0ක් පමණ දක්වා පහත වැටුණු බ්‍රෙන්ට් බොරතෙල් මිල, ඉන්පසු ප්‍රධාන වශයෙන් බොරතෙල් තොග සීමිත වීම මෙන් ම, එක්සත් ජනපදයෙහි සහ චීනයෙහි ආර්ථික කටයුතු පුළුල් වීම හේතුවෙන් ක්‍රමයෙන් ඉහළ ගොස් 2020 වසරේ අගෝස්තු අවසානය වන විට බැරලයට එ.ජ. ඩොලර් 46.1ක් දක්වා ළඟා විය. කෙසේ වෙතත්, 2020 වසරේ ඔක්තෝබර් මැද වන විට බොරතෙල් මිල බැරලයකට එ.ජ ඩොලර් 43.4ක් පමණ දක්වා අඩුවිය. ලෝක ආර්ථික ඉදිරි දැක්මෙහි 2020 ඔක්තෝබර් ප්‍රකාශනයට අනුව, ඉන්ධන මිලෙහි සාමාන්‍ය 2020 වසරේ දී බැරලයකට එ.ජ. ඩොලර් 41.7ක් සහ 2021 වසරේ දී එ.ජ. ඩොලර් 46.7ක් ලෙස පුරෝකථනය කර ඇත.

- **සමාජයේ අවදානමට ලක් විය හැකි කණ්ඩායම් කෙරෙහි වසංගතයෙහි බලපෑම සැලකිය යුතු ලෙස ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය වශයෙන් දරිද්‍රතාවය හා අසමානතාවය ඉහළ යැම හේතුවෙන් පසුගිය දශක කිහිපය තුළ අත්කරගත් ප්‍රගතිය අඩාල විය හැකිය.** කාන්තාවන්, අවිධිමත් අංශයේ රැකියාවල නියුතු වූවන්, තරුණ කම්කරුවන් සහ සාපේක්ෂව අඩු අධ්‍යාපන මට්ටමක් ලබා ඇති අය වැනි විවිධ කාණ්ඩ කෙරෙහි අර්බුදයෙහි සමානුපාතික නොවන බලපෑම හේතුවෙන් අසමානතාවය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංචරණ සීමා පැනවීම හේතුවෙන් දෛනික වැටුප් මත යැපෙන පුද්ගලයින් සහ සංක්‍රමණික සේවකයින් ඇතුළු විධිමත් සමාජ ආරක්ෂණ ජාල වැඩපිළිවෙළකට යටත් නොවන පුද්ගලයින්ට අනපේක්ෂිත ලෙස සිය ආදායම් මාර්ග අහිමි වීම්වලට මුහුණ දීමට සිදු විය. තව ද, අර්බුද හේතුවෙන් පැන නැගුණු අසීරුතාවය කලාප මෙන්ම ජාතීන් අතර අසමාන විය. සමහර දියුණු ආර්ථිකයන්වල, නිවාසවල සිට සේවයන්හි නියුක්ත වීමේ සැලැසුම් කඩිනමින් ක්‍රියාත්මක කරන ලද අතර, එසේ නැතහොත් පුද්ගලික ඉතිරිකිරීම් හෝ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ මත රඳා පැවතීමට එම රටවල පුද්ගලයන්ට හැකි විය. අනුවර්තනය වීමේ හැකියාව සාපේක්ෂව මන්දගාමී වූ අඩු ආදායම්ලාභී ආර්ථිකයන් තුළ, අනපේක්ෂිත ලෙස ආදායම් අහිමි වීම් වළක්වා ගැනීමේ දී පුද්ගලයන්ට බොහෝ විට දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදු විය. වසංගතයට මුහුණදීමේ දී අඩු ආදායම්ලාභී ආර්ථිකයන් සඳහා ජාත්‍යන්තර සහයෝගයේ වැදගත්කම මෙයින් අවධාරණය කෙරේ.

- **වසංගතය පැතිරීම පිළිබඳ අවිනිශ්චිතතාවය ගෝලීය ආර්ථිකයේ ඉදිරි දැක්ම පිළිබඳ තක්සේරු කිරීම් කෙරෙහි අඛණ්ඩව බලපානු ඇත.** වර්තමාන පුරෝකථන පදනම් වී ඇත්තේ මහජන සෞඛ්‍ය සහ පුරෝකථන කිරීමට සාමාන්‍යයෙන් අපහසු ආර්ථික සාධක මතය. ගෝලීය මූල්‍ය වෙළඳපොළවල අවිනිශ්චිතතාවයන් ඉහළ නැගීම මෙන් ම, සමස්ත ඉල්ලුම, අඩු මට්ටමක පැවතීම සංචාරක කර්මාන්තය අඩපණ වීම සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු වීම මගින් වන ගෝලීය බලපෑම කෙතරම් ද යන්න අවිනිශ්චිතව පවතී. තව ද, කොවිඩ්-19 වසංගතයේ දෙවන රැල්ල දිගුකාලීනව පැවතුණහොත් බහුපාර්ශ්වීය නියෝජිතායතන විසින් කරන ලද නවතම පුරෝකථනවල අපේක්ෂිත මට්ටමට වඩා ආර්ථික කටයුතු පහළ යනු ඇත. එක් එක් රටවල දුර්වල බාහිර ඉල්ලුම සහ දැඩි මූල්‍ය තත්ත්වයන්වල ගෝලීය බලපෑම වෙනත් රටවලට පැතිරීම හේතුවෙන් ගෝලීය ආර්ථික වර්ධනය කෙරෙහි සැලකිය යුතු ලෙස අහිතකර බලපෑම් එල්ල විය හැකිය. දීර්ඝ කාලීන ආර්ථික පසුබෑම සහ ගෝලීය වෙළඳපොළ තත්ත්වයන්වල විචලන දිගින් දිගටම පැවතුණහොත්, සමහර නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ණය සංයුතිය සහ ණයවල තිරසාරභාවය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල විය හැකිය. කෙසේ නමුත්, කොවිඩ්-19 වසංගතය සඳහා එන්නතක් සකස් කිරීමට දරන අඛණ්ඩ ප්‍රයත්නයන් සහ ගෝලීය වශයෙන් අඛණ්ඩව හා මහා පරිමාණව දක්වන ප්‍රතිපත්ති සහයෝගීතාවය හමුවේ ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වීම පිළිබඳව ඇති වාසිදායක තත්ත්වයන් ද නොසලකා හැරිය හැකි නොවේ.

## අපේක්ෂිත වර්ධනයන්

- **ඔක්තෝබර් මාසයේ දී දක්නට ලැබුණු පරිදි කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව නැවත ඉහළ යෑම යම් දුරකට ආර්ථික වර්ධනය සඳහා අහිතකර ලෙස බල පෑ හැකි නමුත්, 2020 වසරේ මැයි මාසයේ දී සමාජ හා ආර්ථික කටයුතුවලට පනවා තිබූ සීමා ලිහිල් කිරීමත් සමඟ ආර්ථික කටයුතුවල සිදු වූ වේගවත් වර්ධනය මගින් නිරූපණය වූ ආකාරයට 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය නැවතත් යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මහ බැංකුව සහ රජය විසින් සපයනු ලැබූ මහා පරිමාණ ප්‍රතිපත්තිමය සහයෝගය මගින් කෙටි කාලීනව ආර්ථික ක්‍රියාකාරකම් වේගයෙන් යථා තත්ත්වයට පත් කිරීමට පහසුකම් සපයනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, රජයේ ආර්ථික වර්ධනය මූලික කරගත් ප්‍රතිපත්ති හේතුවෙන් මැදිකාලීනව ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම තිරසාර වනු ඇතැයි අපේක්ෂිතය. වසංගතය හේතුවෙන්, විශේෂයෙන් ම, දෙවන කාර්තුවේ දී ඇති වූ බලපෑම පිළිබිඹු කරමින්, 2020 වසරේ දී ආර්ථිකය සියයට 1.7ක පසුබෑමක් පෙන්නුම් කරනු ඇතැයි පුරෝකථනය කර ඇත. මේ දක්වා ලබා දී ඇති පුළුල් රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති සානුබලයන්ගෙන් පසුකාලීනව ඇතිවන බලපෑම ද සමඟ දේශපාලන ස්ථාවරත්වය තහවුරු වීම හේතුවෙන් ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ යෑමත්, ආර්ථික වර්ධනය මූලික කරගත් රජයේ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමත් ඉදිරි කාලසීමාව තුළ දී තිරසාර හා සෑමට සාධාරණ ආකාරයේ වර්ධනයකට සහාය වනු ඇත. කෙටි කාලීනව ආර්ථික කටයුතුවලට ඇති වූ බාධා මධ්‍යයේ වුව ද, වසංගතය හේතුවෙන් දේශීය කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනයට වැඩි අවධානයක් යොමු කරමින් ආර්ථික වර්ධනය මූලික කරගත් ප්‍රතිපත්ති හඳුන්වා දීමට ද රජයට අවස්ථාව උදාවිය. 2021 වසර සඳහා වන ජාතික අයවැය එළිදැක්වීමත් සමඟ, අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එය ප්‍රදේශ අතර සම්බන්ධතාවය වැඩි කිරීමටත්, ආර්ථිකයේ ඵලදායිතා ධාරිතාව ඉහළ නැංවීමටත් හේතු වනු ඇත. අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන ප්‍රතිපත්ති ද ඇනුම පදනම් කරගත් ආර්ථික වර්ධන ප්‍රවණතාවන් ප්‍රවර්ධනය කෙරෙන ආකාරයේ උපාය මාර්ගයකට සුදුසු වන ලෙස නැවත සකස් වෙමින් පවතී. සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් කෙරෙහි වසංගතය මගින් කෙටි කාලීනව අහිතකර බලපෑම් ඇති කළ හැකි වුව ද, පවත්නා සුභසාධක වැඩසටහන් ඔස්සේ ඔවුනට කෙටිකාලීනව සහාය ලබා දෙන අතර ම, රජයේ සර්ව සහභාගිත්වයක් සහිත වර්ධන ප්‍රතිපත්ති මගින් සමාජයේ වරප්‍රසාද නොලත් කොටස් වඩා හොඳින් ඉලක්ක කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ ඉහළ අවදානම් තත්ත්වයන් තිබියදීත්, නිසි ප්‍රතිපත්ති නොපමාව ක්‍රියාවට නැංවීමත් සමඟ ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මැදිකාලීනව අවදානම්වලට ශක්තිමත්ව මුහුණ දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ගෝලීය ඉල්ලුම යථා තත්ත්වයට පත්වීමත්, දේශීය නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට සහ අපනයන ශක්තිමත් කිරීමට යොමු වූ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් සමඟ, මැදිකාලීනව අපනයන ඉපැයීම්වල සැලකිය යුතු වැඩිවීමක් අපේක්ෂා කෙරේ. ආනයන වියදම්, 2020 වසරේ දී සැලකිය යුතු අඩු මට්ටමක පැවතිය ද, 2021 වසරේ දී ඉහළ යා හැකිය. තෙල් මිල සාමාන්‍ය තත්ත්වයට පත්වීම සහ දේශීය නිෂ්පාදන හා අපනයනවල අපේක්ෂිත වර්ධනය හේතුවෙන් අන්තර් හා ආයෝජන භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑම ඉදිරි කාලයේ දී ආනයන වියදම් මට්ටම කෙරෙහි බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2020 වසරේ දී සැලකිය යුතු ලෙස අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන වෙළඳ හිඟය, 2021 වසරේ දී සාමාන්‍ය තත්ත්වයන්ට පත්වීමෙන් පසුව මැදිකාලීනව පහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. සංචාරක කර්මාන්තයේ පසුබෑමක් පැවතිය ද, ඉදිරි කාලපරිච්ඡේදය තුළ වසංගත බිය පහව යෑමත් සමඟ සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඒ හේතුවෙන් සේවා ගිණුමේ අතිරික්තය මැදිකාලීනව ක්‍රමයෙන් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තව ද, ප්‍රවාහන සේවා, තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (IT/BPO) යන අංශවල වර්ධනය සේවා අපනයනවල අපේක්ෂිත වර්ධනයට හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මන්දගාමී වුව ද, මැදිකාලීනව වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම ප්‍රවණතාවල ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.5ක් දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන විදේශීය ජංගම ගිණුමේ හිඟය, 2021 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.4ක් දක්වා ඉහළ යනු ඇතැයි ද, 2025 වසර වන විට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.2ක් දක්වා ක්‍රමයෙන් අඩු

වනු ඇතැයි ද පුරෝකථනය කර ඇත. කොවිඩ්-19 වසංගතය හමුවේ රට වෙත ලැබෙන මූල්‍ය ප්‍රවාහ මන්දගාමී වීම කෙටි කාලීනව ගෙවුම් ශේෂයෙහි මූල්‍ය ගිණුම කෙරෙහි බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, දේශපාලන ස්ථාවරත්වය නැවත ඇති වීම හේතුවෙන් ආයෝජකයින් තුළ ධනාත්මක අපේක්ෂාවන් ඇතිවීමත්, ගෝලීය ආර්ථිකය අපේක්ෂිත ලෙස යථා තත්ත්වයට පත්වීමත් සමඟ විදේශීය ඍජු ආයෝජන ලැබීම් සහ කොළඹ කොටස් වෙළඳපොළ හා රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන මැදිකාලීනව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්, කොළඹ වරාය නගරය සහ හම්බන්තොට කාර්මික කලාප ව්‍යාපෘති සඳහා විදේශීය ආයෝජන ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. නම්‍යශීලී හා තරගකාරී විනිමය අනුපාතිකයක් පවත්වා ගනිමින් මැදිකාලීනව විදේශීය සංචිත ප්‍රමාණවත් මට්ටම්වල පවත්වා ගැනීමට මහ බැංකුව අපේක්ෂා කරයි. කෙටි කාලීනව, ප්‍රමාණවත් මූල්‍යකරණයක් සහතික කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගනිමින් ද, දිගු කාලීනව, ණය නොවන ලැබීම් ලෙස විදේශීය ඍජු ආයෝජන වර්ධනය කර ගන්නා අතරතුර වෙළඳ හා සේවා අපනයනවල අඛණ්ඩ වැඩි වීමක් සහතික කිරීම සඳහා වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නංවමින් ද, ශ්‍රී ලංකාවේ විදේශීය ණයෙහි තිරසාරභාවය සහතික කිරීමට රජය නිසි පියවර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **අවශ්‍යයෙන් ම සිදු කළ යුතු වූ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් හේතුවෙන් 2020 වසරේ දී රාජ්‍ය මූල්‍ය හිඟයන්ගේ සහ රාජ්‍ය ණය මට්ටම්වල සිදු වූ ප්‍රසාරණයෙන් අනතුරුව, අපේක්ෂා කෙරෙන පරිදි ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමත් සමඟ මැදි කාලීනව, රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2020 වසරේ නොවැම්බර් මස මැද භාගයේ දී ඉදිරිපත් කිරීමට යෙදෙන රාජ්‍ය අයවැය සමඟ ප්‍රකාශයට පත් කිරීමට නියමිත රජයේ මැදි කාලීන රාජ්‍ය මූල්‍ය උපායමාර්ගය තුළ බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සිදු කිරීම, පුනරාවර්තන වියදම් තවදුරටත් තාර්කිකරණය කිරීම සහ ප්‍රාග්ධන වියදම්වල කාර්යක්ෂමතාව වැඩි කිරීම මගින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාවත ශක්තිමත් කිරීම සඳහා වන ක්‍රියාමාර්ග ඇතුළත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, තෝරාගත් ක්ෂේත්‍ර කිහිපයක් තුළ දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට සහ රජය සතු වාණිජ ව්‍යවසායන්හි කාර්යසාධනය වැඩි දියුණු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග තුළින් ආර්ථික ක්‍රියාකාරකම් වැඩි දියුණු වීම සඳහා සහායක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන අතර ම, ඉදිරි කාලය තුළ, රජයේ ආදායම් උත්පාදනය සඳහා වැඩි අවකාශයක් සැලසෙනු ඇත. “රට හදන සෞභාග්‍යයේ දැක්ම” යන ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි සඳහන් පරිදි, 2025 වසර වන විට, පුනරාවර්තන ගිණුමේ සහ ප්‍රාථමික ශේෂයන්හි අනුරූප වර්ධනයන් ද සමඟ, අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.0ක මට්ටමක් දක්වා ළඟා වනු ඇතැයි රජය අපේක්ෂා කරයි. අයවැය හිඟයේ අපේක්ෂිත අඩුවීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස අයවැය හිඟය මූල්‍යනයේ පහළ යෑම, දේශීය මූල්‍යනය කෙරෙහි වැඩි වශයෙන් රඳා පවතිමින් මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය අඩු කිරීමටත්, මැදි කාලීනව රාජ්‍ය ණයෙහි තිරසාර බව සහතික කිරීමටත් හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **ඉදිරි කාල සීමාව තුළ දී පෞද්ගලික අංශය වෙත ණය ගලායෑම ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2020 වසර තුළ දී ක්‍රියාත්මක කරන ලද මුදල් වෙළඳපොළ තත්ත්වය ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොළ ණය පොලී අනුපාතික සැලකිය යුතු මට්ටමක් දක්වා අඩු විය. ඉදිරි කාල සීමාව තුළ දී ආර්ථික ක්‍රියාකාරකම් අපේක්ෂිත ලෙස යථාතත්වයට පත් වීමත්, ව්‍යාපාරික විශ්වාසය ඉහළ යෑමත් සමඟ පෞද්ගලික අංශය වෙත ණය ගලායෑමේ වර්ධනය කෙටි කාලීනව ඉහළ ගොස් ඉන් පසුව ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය අංශය විසින් ලබාගත් විශාල ණය ප්‍රමාණය පුළුල් මුදල් ($M_{2b}$) වර්ධනය කෙටි කාලීනව ඉහළ යෑමට හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය වෙත සපයන ණය ප්‍රසාරණය වීම හේතුවෙන් මැදි කාලීනව පුළුල් මුදල් වර්ධනය සියයට 12.5ක පමණ මට්ටමේ ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත සියයට 4-6 පරාසයේ පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.** කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, ඉදිරි කාලයේ දී බොහෝ විට මැදි තනි අගයක මට්ටමේ පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. ක්‍රියාත්මක කරන ලද මුදල් ප්‍රතිපත්ති හා රාජ්‍ය මූල්‍ය සානුබල ක්‍රියාමාර්ගයන්ගේ පසු කාලීන බලපෑම පිළිබිඹු කරමින් සමාහාර ඉල්ලුම ඉහළ යා හැකි වීමත්, ජාත්‍යන්තර වෙළඳපොලේ තෙල් මිල සාමාන්‍ය මට්ටමට පත් විය

හැකි වීමත් නිසා 2022 සහ 2023 කාලයේ දී උද්ධමනය ඉලක්කගත පරාසයේ ඉහළ සීමාවට ළඟා විය හැකිය. සැපයුම් අංශය සැලකූ විට, ඇතැම් කෘෂිකාර්මික නිෂ්පාදනයන්හි ස්වයංපෝෂිත තත්ත්වයන් ළඟා කර ගැනීම සඳහා රජය ගනු ලබන උත්සාහය මගින් දේශීය ආහාර උද්ධමනය ඉදිරි කාලයේ දී ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉල්ලුම හේතුවෙන් ඇතිවන අනවශ්‍ය උද්ධමනකාරී පීඩන වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමට මහ බැංකුව සූදානම්ව සිටින අතර, අඩු හා ස්ථාවර උද්ධමනයක් සහ මැදි කාලීනව තිරසාර ආර්ථික වර්ධනයක් සහතික කිරීම සඳහා තාවකාලිකව ඇතිවන සැපයුම් අංශයේ පීඩන අඩු කිරීමට මෙන් ම, අපේක්ෂිත පරිදි රාජ්‍ය මූල්‍ය ශේෂයන් කළමනාකරණය කිරීමට රජය දක්වන කැපවීම ද වැදගත් වේ.

- **පුරෝකථනය කරන ලද මැදි කාලීන සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීම, හඳුනාගෙන ඇති ප්‍රතිසංස්කරණ ඉදිරි කාලය තුළ දී ක්‍රියාත්මක කිරීම මත රඳා පවතී.** ස්ථාවර රජයක් ස්ථාපිත වීමත් සමග ම, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති යළි විමසා බලා, යෝග්‍ය ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ දීර්ඝ කාලීන සංවර්ධන ඉලක්ක සැකසීමට පවතින වසංගත තත්ත්වය අවස්ථාවක් උදා කර දී තිබේ. මේ අනුව, හඳුනාගත් භාණ්ඩ රට තුළ ම නිපැයීම දිරිමත් කිරීම සහ සහයෝගය ලබාදීම සඳහා වන රජයේ ව්‍යායාමය මෙරට ඉදිරි ආර්ථික පරිවර්තනය සඳහා තීරණාත්මක කාර්ය භාරයක් ඉටුකරනු ඇත. කෙසේ වෙතත්, මෙමගින් අපේක්ෂිත මැදි කාලීන සහ දීර්ඝ කාලීන ප්‍රතිලාභ අත්කර ගැනීමට නම්, දේශීය නිෂ්පාදනවල

**1.3 සංඛ්‍යා සටහන**

**මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව (අ)**

| දර්ශකය | ඒකකය | 2018 (ආ) | 2019 (ඇ) | පුරෝකථන (ඈ) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| **මූර්ත අංශය** | | | | | | | | | |
| මූර්ත ද.දේ.නි. | සියයට | 3.3 (ඇ) | 2.3 | - 1.7 | 5.0 | 4.5 | 6.0 | 6.5 | 7.0 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් බිලියන | 14,366 (ඇ) | 15,016 | 15,462 | 17,054 | 18,864 | 21,205 | 23,822 | 26,773 |
| ඒක පුද්ගල ද.දේ.නි. | එ.ජ. ඩොලර් | 4,079 (ඇ)(ඉ) | 3,852 | 3,825 | 4,068 | 4,340 | 4,706 | 5,100 | 5,529 |
| මුළු ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 30.4 (ඇ)(ඊ) | 27.4 | 26.9 | 27.3 | 27.8 | 28.1 | 28.4 | 28.7 |
| දේශීය ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 23.0 (ඇ)(ඊ) | 21.3 | 21.4 | 21.5 | 22.5 | 23.9 | 24.9 | 25.7 |
| ජාතික ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 27.3 (ඇ)(ඊ) | 25.3 | 25.4 | 24.9 | 25.5 | 26.3 | 27.1 | 27.5 |
| **විදේශීය අංශය** | | | | | | | | | |
| වෙළඳ පරතරය | ද.දේ.නි.යේ % වශයෙන් | -11.7 | - 9.5 | - 6.6 | - 8.2 | - 8.8 | - 8.2 | -7.9 | -7.5 |
| අපනයන | එ.ජ. ඩොලර් මිලියන | 11,890 | 11,940 | 10,245 | 12,404 | 13,682 | 15,124 | 17,022 | 18,559 |
| ආනයන | එ.ජ. ඩොලර් මිලියන | 22,233 | 19,937 | 15,800 | 19,733 | 22,154 | 23,814 | 26,066 | 28,002 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -3.2 | - 2.2 | - 1.5 | - 2.4 | - 2.3 | - 1.8 | -1.3 | -1.2 |
| විදේශීය නිල සංචිත | ආනයනික මාස වශයෙන් | 3.7 | 4.6 | 4.8 | 3.7 | 3.8 | 3.9 | 4.0 | 4.0 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | | | | | | |
| සමස්ත ආදායම් සහ ප්‍රදාන | ද.දේ.නි.යේ % වශයෙන් | 13.5 (උ) | 12.6 | 9.7 | 10.6 | 11.2 | 11.8 | 12.4 | 13.1 |
| වියදම හා ශුද්ධ ණය දීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 18.7 (උ) | 19.4 | 18.9 | 18.4 | 18.3 | 17.8 | 17.6 | 17.1 |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -1.2 (උ) | - 2.7 | - 6.3 | - 4.8 | - 4.0 | - 2.6 | - 1.7 | - 0.5 |
| ප්‍රාථමික ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | 0.6 (උ) | - 0.8 | - 3.2 | - 2.0 | - 1.5 | - 0.7 | - 0.2 | 0.6 |
| සමස්ත අයවැය හිඟය | ද.දේ.නි.යේ % වශයෙන් | -5.3 (උ) | - 6.8 | - 9.3 | - 7.8 | - 7.1 | - 6.0 | - 5.2 | - 4.0 |
| මධ්‍යම රජයේ ණය | ද.දේ.නි.යේ % වශයෙන් | 83.7 (උ) | 86.8 | 93.0 | 92.4 | 90.0 | 86.1 | 82.3 | 77.5 |
| **මුදල් අංශය සහ උද්ධමනය** | | | | | | | | | |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) (ඌ) | සියයට | 13.0 | 7.0 | 20.6 | 15.0 | 12.5 | 12.5 | 12.5 | 12.5 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය ($M_{2b}$ හි) (ඌ) | සියයට | 15.9 | 4.3 | 6.0 | 13.9 | 12.5 | 12.0 | 12.0 | 12.0 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (එ) | සියයට | 4.3 | 4.3 | 4.7 | 5.0 | 5.8 | 6.0 | 5.5 | 5.0 |

(අ) 2020 ඔක්තෝබර් මස මැද වන විට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) මහ බැංකුවේ පුරෝකථන වේ.
(ඉ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඊ) 2018 වසර සඳහා ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, 28.6%, 21.2%, සහ 25.4%ක් වූ මුළු ආයෝජන, දේශීය ඉතුරුම් සහ ජාතික ඉතුරුම් පිළිබඳ දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලදී.
(උ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 මාර්තු 31 දින නිකුත් කරන ලද 2018 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඌ) වසර අවසානයේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය
(එ) කො.පා.මි. දර්ශකය (2013 - 100) මත පදනම් වේ.

මූලයන් : මුදල් අමාත්‍යංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ගුණාත්මක බව පවත්වාගෙන යෑම මෙන්ම, ඒවා සාධාරණ මිලකට මිල දී ගත හැකි වීම ද අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් ම, කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත අංශයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා නවෝත්පාදනය, පර්යේෂණ සහ සංවර්ධනය සඳහා ප්‍රමාණවත් තරම් ආයෝජනය කිරීම සහ සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වේ. අපේක්ෂිත පරිදි ඉහළ වර්ධන වේගයක් අත්කර ගැනීමට නම්, අන්තර්ජාතික වෙළඳපොළ වෙත පිවිසුම වැඩි කිරීම අවශ්‍යයෙන් ම සිදු කළ යුතු බැවින්, දැනට සිටින සහ නව පාර්ශවකරුවන් සමග නව වෙළඳ ගිවිසුම්වලට එළඹීම අඛණ්ඩව සිදු කළ යුතුය. එසේම, කම්කරු, ඉඩම් සහ ප්‍රාග්ධන වෙළඳපොළ හා සම්බන්ධ ප්‍රතිසංස්කරණ ද මෙහිදී අත්‍යවශ්‍ය වනු ඇත. කාලීන, යෝග්‍ය සහ පාරදෘශ්‍ය ප්‍රතිපත්ති ඔස්සේ දැනට පවතින අඩු උද්ධමන වාතාවරණය පවත්වාගෙන යා යුතුව ඇති අතර, එය ගෘහස්ථ සහ ව්‍යාපාර ඒකකයන්ට වඩා නිශ්චිතතාවයකින් යුතුව තීරණ ගැනීමට අවකාශ සලසනු ඇත. වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවන කෙටිකාලීන ආර්ථික දුෂ්කරතාවලට ඔබ්බෙන් වූ දිගු කාලීන සංවර්ධනය සහ සාර්ව ආර්ථික ස්ථායීතාවය, සෑමට සමෘද්ධිය සැලසීම සඳහා වන ගමනේ දී ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ අරමුණු විය යුතු වේ.